ශ්‍රී ලංකා රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව
இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்
State Pharmaceuticals Corporation of Sri Lanka

# 2022
# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT

# වාර්ෂික වාර්තාව
# 2022

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# අන්තර්ගතය


- අපගේ දර්ශනය, මෙහෙවර, පරමාර්ථ සහ පාඨය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- අධ්‍යක්ෂ මණ්ඩලය 03
- ආයතනික තොරතුරු 04
- කළමනාකාර මණ්ඩලය 05 - 06
- සභාපතිතුමාගේ ප්‍රකාශය 07
- කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය 08 - 09
- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 10 - 11
- විගණන කමිටු වාර්තාව 12
- ආයතනික පාලන වාර්තාව 13 - 14
- මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම 15
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 16
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 17
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 18
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 19
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 20 - 29
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 30 - 60
- විගණකාධිපතිගේ වාර්තාව 61 - 79
- මානව සම්පත් විශ්ලේෂණය 80
- ආදායම් වාර්තාව සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 81
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 82
- විකුණුම් ජාලය 83


**ඔබේ සුවසෙත අපේ පැතුමයි**

## අපගේ දර්ශනය

*නීරෝගීමත් ජාතියක් ගොඩනැංවීමේ ප්‍රධාන සහකරු බවට පත්වීම.*

## අපගේ මෙහෙවර

*ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කරමින්, උසස් තත්ත්වය සහතික කල ආරක්ෂාකාරී හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවා සපයන ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.*

## අපගේ පරමාර්ථ

*ජනතා සේවයට ප්‍රමුඛතාවය*
*ගුණාත්මක බව හා ආරක්ෂාව*
*අසමසම අවංකභාවය*
*විශ්වාසදායක හවුල්කරුවෙකු සහ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම*
*විශිෂ්ඨ කාර්යසාධනය සඳහා බැඳීම*
*අවශ්‍යතා හඳුනාගැනීම.*

## අපගේ පාඨය

*ඔබේ සුවසෙත අපේ පැතුමයි.*

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### ප්‍රතිඵල සාරාංශය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
ප්‍රතිඵල සාරාංශය

| විස්තරය | 2022 රු."000" | 2021 රු."000" | විචලනය (%) | 2020 රු."000" |
|---|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් | 9,945,849 | 9,446,822 | 5.3 | 8,798,047 |
| රජයේ බෙහෙත් ගබඩාවට කල සැපයුම් | 40,973,117 | 70,853,255 | (42.2) | 54,323,565 |
| **මුළු ආදායම** | **50,918,966** | **80,300,077** | **(36.6)** | **63,121,612** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.සං | 2,069,584 | 2,224,536 | (7.0) | 2,249,676 |
| දළ අතිරික්තය - ර.බෙ.ග. | 2,789,095 | 4,584,027 | (39.2) | 3,415,073 |
| **දළ අතිරික්තය** | **4,858,679** | **6,808,564** | **(28.6)** | **5,664,749** |
| වෙනත් ආදායම් | 107,110 | 88,531 | 21.0 | 287,363 |
| පරිපාලන වියදම් | (2,059,292) | (1,967,159) | (4.7) | (1,753,834) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (2,045,592) | (1,158,052) | (76.6) | (962,078) |
| මූල්‍ය පිරිවැය | (13,974) | (10,556) | (32.4) | (10,588) |
| බැංකු අයිරා පොළී | (140) | (569,624) | 100.0 | (686,878) |
| මූල්‍ය ආදායම් | 7,643 | 6,943 | 10.1 | 6,890 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **854,433** | **3,198,647** | **(73.3)** | **2,545,624** |
| විශ්‍රාමික පාරිතෝෂික | 86,102 | 57,438 | 49.9 | (191,755) |
| ප්‍රත්‍යාගණන ලාභය | 71,351 | - | 100.0 | - |
| බදු ගෙවීම් | (307,895) | (782,231) | 60.6 | (576,401) |
| **එකතු විස්තීරණ ආදායම** | **802,177** | **2,473,854** | **(67.6)** | **1,777,468** |
| රඳවාගත් ලාභ | 14,585,025 | 14,007,731 | 4.1 | 12,208,679 |
| දායක ප්‍රාග්ධනය හා සංචිත | 125,117 | 125,117 | - | 125,117 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 71,351 | - | 100 | - |
| ජංගම නොවන වත්කම් | 2,465,268 | 2,351,604 | 4.8 | 2,329,488 |
| ජංගම වත්කම් | 63,811,199 | 56,650,953 | 12.6 | 39,087,956 |
| ජංගම නොවන වගකීම් | 8,004,715 | 9,904,471 | (19.2) | 11,908,162 |
| ජංගම වගකීම් | 43,686,727 | 34,965,237 | (24.9) | 17,175,486 |
| ශුද්ධ ජංගම වත්කම් | 20,124,472 | 21,685,716 | (7.2) | 21,912,470 |
| **මූලික අනුපාත** | | | | |
| දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං | 20.8 | 23.5 | | 25.6 |
| දළ ලාභ අනුපාතය (%) ර.බෙ.ග. | 6.8 | 6.5 | | 6.3 |
| දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%) | 9.5 | 8.5 | | 9.0 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%) | 3.8 | 15.7 | | 13.3 |
| පොළී ආවරණය (වාර) | 6,104.1 | 6.62 | | 4.7 |
| ස්කන්ධයට මුළු වත්කම් (වාර) | 1:5 | 1:4.2 | | 1:3.3 |
| යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර) | 1:2.2 | 1:3.3 | | 1:2.6 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.4 | 1:1.6 | | 1:2.7 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.4 | 1:1.6 | | 1:2.1 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 2.8 | 2.75 | | 2.3 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 919 | 948 | | 956 |
| සේවකයෙකුගේ ඉපයීම (රු.) | 930 | 3,374 | | 2,663 |
| සේවකයෙකුට විකුණුම් (රු.) | 55,407 | 84,705 | | 66,027 |

# අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු

## අධ්‍යක්ෂ මණ්ඩලය

### සරත් ලියනගේ මහතා - සභාපති

සරත් ලියනගේ මහතා වසර 38 ක පළපුරුද්ද ඇති නීතිවේදියෙකු හා දිවුරුම් කොමසාරිස්වරයෙකු වේ. ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා වූ සියලුම අධිකරණ වල පෙනී සිට ඇති ඒ මහතා ජෙනරාල් කොබ්බෑකඩුව හා විජය විමලරත්න මහත්වරුන් ජීවිතක්ෂයට පත්වූ කයිට්ස් හි පිපිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමට පත්කරනු ලැබූ විශේෂ ජනාධිපති කොමිසම වෙනුවෙන් මුල සිට පෙනී සිට ඇති අතර ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩල ශාලාවේ රැස්වූ අග්‍රවිනිශ්චයකාරවරු දෙදෙනෙකුගෙන් හා නයිට්වරයෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර කොමිසමක මුල සිට පෙනී සිට ඇත.

විධායක අධ්‍යක්ෂ හා සභාපති ලෙස රජයේ ආයතන ගණනාවක පළපුරුද්ද ඇති ඒ මහතා ප්‍රසිද්ධ සමාගම් සමූහයක නීති උපදේශක ලෙසත් සමාගම් අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. රාජ්‍ය නොවන සංවිධානයක් වන ශ්‍රී ලංකාවේ දුප්පතුන් වෙනුවෙන් වූ PME අරමුදලේ සභාපතිවරයා ලෙස ශ්‍රී ලංකාවේ දුප්පත් ජනතාව වෙනුවෙන් කටයුතු කරයි.

සරත් ලියනගේ මහතා 2015 ජනවරි මස සිට 2019 ජනවාරි මස දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වරයා ලෙසද කටයුතු කරන ලදී.

### වෛද්‍ය එම්.වයි.කේ.විල්ෆ්‍රඩ් - කළමනාකාර අධ්‍යක්ෂ

වෛද්‍ය එම්.වයි.කේ. විල්ෆ්‍රඩ් මහතා වෛද්‍ය පරිපාලනය පිළිබඳ උපදේශක වරයෙක් වේ. වෛද්‍ය එම්.වයි.කේ. විල්ෆ්‍රඩ් මහතා ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය සේවයට 1984 දී සම්බන්ධවී ඇති අතර ඔහු C.G. (එක්සත් රාජධානිය), MD, MSC හා MBBS උපාධිධාරියෙකි. ඒ මහතා පර්යන්ත රෝහල් වල සිට ශ්‍රී ලංකාවේ දකුණු කොළඹ ශික්ෂණ රෝහල ඇතුළු ප්‍රමුඛ පෙළේ මහ රෝහල් වල වසර 34 කට අධික සේවා කාලයක් ඇති රෝහල් පරිපාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ වෛද්‍ය වෘත්තිකයෙකි. ඔහු සෞඛ්‍ය අමාත්‍යංශයේ වැඩබලන අධ්‍යක්ෂ - තෘතීයික සත්කාර (Tertiary Care) ලෙස හා වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කර ඇත. වෛද්‍ය විල්ෆ්‍රඩ් මහතා පරිපාලනය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති අතර ජාතික අක්ෂි රෝහල, ජාතික දන්ත රෝහල හා ශ්‍රී ලංකාවේ ජාතික පිළිකා රෝහලේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇත.

ඔහු 2019 වසරේ දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරන ලදී.

### ඊ. ඒ. රත්නසීල මහතා

ඊ.ඒ.රත්නසීල මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක් වන අතර ඔහු වසර 20 කට වැඩි කාලයක් මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වල සේවය කර ඇත. රුහුණු විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ඇති රත්නසීල මහතා ඇමරිකා එක්සත් ජනපදයේ (Williams College) විලියම්ස් විද්‍යාලයෙන් ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව පිළිබඳ සිය ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මහා භාණ්ඩාගාරයේ ඔහුගේ දීර්ඝ සේවා කාලය තුළ රත්නසීල මහතා NDB බැංකුව, NSBM හරිත විශ්වවිද්‍යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ Ceylon Petroleum Storage Terminals Ltd යන ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත.

### මහාචාර්ය දුශාන්ත මැදගෙදර

මහාචාර්ය දුශාන්ත මැදගෙදර පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් MBBS උපාධිය ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයෙන් MD උපාධිය ලබා ඇත. ඒ මහතා MBBS. MD හා DTCD වෛද්‍ය උපාධි සඳහා පරීක්ෂකයෙකු වන අතර දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බොහෝ දේශන පවත්වා ඇත. ඔහුට ඇමරිකන් කොලේජ් ඔෆ් චෙස්ට් ෆිසිෂන්ස් (American College of Chest Physicians), රෝයල් කොලේජ් ඔෆ් ෆිසිෂන්ස් එඩින්බර්ග් (Royal College of Physicians Edinburg), ආසියා පැසිෆික් ශ්වසන විද්‍යා සංගමය (Asia Pacific Society of Respirology ) හා ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයෙන් අධිශිෂ්‍යත්ව පිරිනමා ඇත.

මහාචාර්ය මැදගෙදර මහතා බොහෝ ජාතික මාර්ගෝපදේශ වල සම - කර්තෘ වන අතරම දේශීය හා ජාත්‍යන්තර කීර්තිමත් සඟරාවල බොහෝ පර්යේෂණ පත්‍රිකා සහ ප්‍රකාශන 240 කට වඩා ලියා ඇත. ඔහු ජාතික සහ ජාත්‍යන්තර සඟරා කිහිපයක සමාලෝචකයෙකු වන අතර Respirology ඇතුළු බොහෝ ජාත්‍යන්තර හා ජාතික සඟරාවල කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෙකු ද වේ. කීර්තිමත් යුරෝපියන් රෙස්පිරොලොජි ජර්නලය (European Respirology Journal) හි සහකාර කර්තෘ වරයෙකු වූ ඔහු දැනට ශ්‍රී ලංකා කොලේජ් ඔෆ් පුල්මොනොලොජිස්ට්ස් (Sri Lanka College of Pulmonologists ) නිල සඟරාවේ "Respire" ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කරයි.

මහාචාර්ය දුශාන්ත මැදගෙදර මහනුවර වෛද්‍ය සංගමයේ බිබිලේ අනුස්මරණ දේශනය සහ පර්යේෂණ අගය සම්බන්ධ දේශනයත් ශ්‍රී ලංකා කොලේජ් ඔෆ් පුල්මොනොලොජිස්ට්ස් (College of Pulmonologists) හි සී.ජේ.ඌරගොඩ දේශනයත් යන කීර්තිමත් දේශන තුනෙන් පිදුම් ලැබුවෙකි. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ කවුන්සිලයෙන් 2013 හා 2015 කුසලතා පර්යේෂණ සම්මානයෙන් ද ඔහු පිදුම් ලැබීය. ඒ මහතා ශ්‍රී ලංකා කොලේජ් ඔෆ් පුල්මොනොලොජිස්ට්ස් (College of Pulmonologists) සභාපති ලෙසත් (2021-2015) ශ්වසන රෝග පිළිබඳ විශේෂඥ සංගමයේ (Respiratory Board) සභාපති ලෙසද වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ, නියෝජ්‍ය ප්‍රධානියා, සහ 2016-2022 ආසියා පැසිෆික් ශ්වසන විද්‍යා සංගමය (Asia Pacific Respiratory Society) හි තේරී පත්වූ ප්‍රධානියා වශයෙන්ද කටයුතු කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාල කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙසත් මහනුවර වෛද්‍ය සංගමයේ ලේකම්, භාණ්ඩාගාරික, හිටපු සභාපති මෙන්ම ඇසෝසියේෂන් ඔෆ් පුල්මොනොලොජිස්ට්ස් (Association of Pulmonologists) පළමු ලේකම් සහ හිටපු සභාපති මෙන්ම ලංකා කොලේජ් ඔෆ් පුල්මොනොලොජිස්ට්ස් (Sri Lanka College of Pulmonologist) ආයතනයේ ප්‍රධාන කර්තෘ ඇතුළු විවිධ වෛද්‍ය සංගම්වල නිල තනතුරු රැසක් හොබවා ඇත.

ඒ මහතා මේ වනවිට E-Health APSR හි ප්‍රධානියා ලෙසත් pleural disease assembly of APSL හි ප්‍රධානියා ලෙසත් කටයුතු කරයි.

මහාචාර්ය දුශාන්ත මැදගෙදර මහතා දැනට වයඹ දිග විශ්වවිද්‍යාලයේ වෛද්‍ය අංශයේ ප්‍රධාන මහාචාර්යවරයා ලෙසත් මහනුවර ජාතික රෝහලේ ජ්‍යෙෂ්ඨ ශ්වසන රෝග විශේෂඥ වෛද්‍යවරයා ලෙසත් කටයුතු කරයි.

### වෛද්‍ය චින්තක ද සිල්වා

වෛද්‍ය චින්තක ද සිල්වා මහතා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ජ්‍යෙෂ්ඨ උපදේශක වෛද්‍යවරයෙකු හා පොලිස් රෝහලේ උපදේශක වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරයි. එතුමා වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන අතර වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ හිටපු ලේකම්වරයා ද වේ.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
### ආයතනික තොරතුරු

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| සරත් ලියනගේ මහතා | සභාපති | (2022.07.11 සිට) |
| වෛද්‍ය එම්. වයි. කේ. විල්ෆ්‍රඩ් | කළමනාකාර අධ්‍යක්ෂ | (2022.07.11 සිට) |
| වෛද්‍ය යූ. ඩී. එස්. සමරසිංහ මහතා | වැඩබලන සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ | (2022.07.09 දක්වා) |
| වෛද්‍ය අයි. පී. හල්පගේ මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | (2022.04.01 සිට 2022.07.09 දක්වා) |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | අධ්‍යක්ෂ | (2022.09.02 සිට) |
| වෛද්‍ය ආර්. එම්. ඩී. මැදගෙදර මහතා | අධ්‍යක්ෂ | (2022.09.02 සිට) |
| ටී. ඒ. රත්නසීල මහතා | අධ්‍යක්ෂ | (2022.03.23 සිට) |
| වෛද්‍ය ඒ. කේ. එස්. බී. ද අල්විස් මහතා | අධ්‍යක්ෂ | (2022.07.05 දක්වා) |
| මහාචාර්ය බී. ඩී. ගමගේ මහතා | අධ්‍යක්ෂ | (2022.09.06 දක්වා) |
| එච්. ජී. බි. එස්. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ | (2022.08.31 දක්වා) |
| හිරන්‍යා ද මෙල් මහතා | අධ්‍යක්ෂ | (2022.08.31 දක්වා) |
| එම්. ආර්. වී. ආර් මීපුර මහතා | අධ්‍යක්ෂ | (2022.03.07 දක්වා) |

**විගණන කමිටුව**

| | | |
|---|---|---|
| ටී.ඒ. රත්නසීල මහතා | සභාපති | (2022.03.23 දක්වා) |
| හිරන්‍යා ද මෙල් මහතා | සාමාජික | (2022.06.22 දක්වා) |
| වෛද්‍ය ඒ. කේ. එස්.බී. ද අල්විස් මහතා | සාමාජික | (2022.06.22 දක්වා) |
| වෛද්‍ය ආර්. එම්. ඩී. මැදගෙදර මහතා | සාමාජික | (2022.09.02 සිට) |

---

**විගණකවරු**

විගණකාධිපති තුමා,
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**බැංකුකරුවෝ**

**ලංකා බැංකුව**

ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත,කොළඹ 01.

**මහජන බැංකුව**

ජාත්‍යන්තර ශාඛාව, තැ.පෙ. 437, ඒ.එන්.සී.එල් ගොඩනැගිල්ල,
ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

**ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව**

තැ.පෙ. 112, 37 යෝර්ක් වීදිය, කොළඹ 01.

**කොමර්ෂල් බැංකුව**

නගර ශාඛාව, 98 යෝර්ක් වීදිය, කොළඹ 01.

**ලියාපදිංචි කාර්යාලය**

අංක. 75. සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

**ව්‍යාපාරික කාර්යාලය**

16 වන මහල, අංක 41, මෙහෙවර පියස, කිරුල පාර, කොළඹ 05.

**සංස්ථාපනය කළ දිනය**

1971 සැප්තැම්බර් 22.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### කළමනාකරණ මණ්ඩලය



**කේ. එම්. ඩී. ආර්. දසනායක මහතා - සාමාන්‍යාධිකාරී**

දිනූෂ දසනායක මහතා කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස 1999 දෙසැම්බර් 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2009 ජූනි මස 1වන දින සිට මේ දක්වා සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වරයා ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී වරයා ලෙස පත්වීමට ප්‍රථම සංස්ථාවේ මානව සම්පත්, පරිපාලන, නීති හා ආනයන අංශවල සේවය කර ඇති අතර එම අංශවල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයා ලෙස ද කටයුතු කර ඇත.

දිනූෂ දසනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකි. ජපානයේ නගෝයා විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය හා විශේෂිතවූ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු වන ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. ඔහු බලයලත් වාණිජ සමථකරුවෙකු වශයෙන් ද සුදුසුකම් ලබා ඇත.



**හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය**

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කළමනාකරණ ගණකාධිකාරිවරිය ලෙස 2007 ජූලි මස 01 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ ගණකාධිකරණය හා විගණනය යන අංශ පිළිබඳ වසර 24 කට වඩා පලපුරුද්දක් ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) වරලත් ගණකාධිකාරිවරියක් ද, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) ගණකාධිකාරිවරියක් ද වේ. එක්සත් රාජධානියේ වරලත් සහතිකපත්‍ර ගණකාධිකරණ ආයතනයේ (ACCA)UK) සාමාජිකත්වය ද අපේක්ෂාවෙන් සිටී.

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණයට විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් 2001 වසරේදී ලබාගෙන ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි.



**නිම්මිකා තුෂාරි මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී**
**(මානව සම්පත් හා පරිපාලන)**

නිම්මිකා තුෂාරි මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) ලෙස 2018 අගෝස්තු මස 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිධාරිනියක් වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් ප්‍රවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. ඇයට මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳව වසර 24 ක පමණ පළපුරුද්දක් ඇත.



**අයන්ති අල්විස් මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී**
**(ප්‍රසම්පාදන සහ ආනයන - ඖෂධ)**

ඒ. එච්. අල්විස් මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (ප්‍රසම්පාදන සහ ආනයන - ඖෂධ) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී කළමනාකරණ උපාධිය (සාමාන්‍ය) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. එයට අමතරව ඇය SLIDA හි රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලොමාධාරිනියකි.

ඇයගේ විෂය පථයට ඇතුලත්වන ආනයන අංශ හතරෙහි ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් නියමිත කාල රාමුව තුල සම්බන්ධීකරණය කිරීම හා කළමනාකරණය කිරීම ඇය විසින් සිදු කරයි.



**ඩබ්ලිව්.ඒ.කේ.පී. වර්ණ කුමාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**(ප්‍රසම්පාදන හා ආනයන - ශල්‍ය හා රසායනගාර)**

ආඥාපති (විශ්‍රාමික) ඩබ්ලිව්.ඒ.කේ.පී. වර්ණ කුමාර මහතා 2021 වසරේ අගෝස්තු මස 02 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන හා ආනයන - ශල්‍ය හා රසායනගාර) ලෙස රාජ්‍ය ඖෂධ සංස්ථාවට සම්බන්ධ විය. පසුගිය වසර 22 තුළ ඔහු ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා ප්‍රසම්පාදන, සැපයුම්දාම හා ක්‍රමකාර්ය සම්පාදනය සම්බන්ධයෙන් විවිධ කාර්යභාරයන් ඉටුකර ඇත. වර්ණ කුමාර මහතා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් ලොජිස්ටික් මැනේජ්මන්ට් (Logistics Management) පිළිබඳ වාණිජවේදී උපාධිය (B.com) හා ශාස්ත්‍රපති උපාධිය (MBA) ලබාගෙන ඇති අතර එක්සත් රාජධානියේ Bedfordshire විශ්ව විද්‍යාලයෙන් ප්‍රොකියුමන්ට් ලොජිස්ටික් ඇන්ඩ් සප්ලයිචේන් මැනේජ්මන්ට් (Procurement Logistics & Supply Chain Management) සම්බන්ධ විද්‍යාවේදී උපාධිය (Msc.) ලබා ඇත. වර්ණ කුමාර මහතා දීර්ඝකාලීන භාණ්ඩ හා කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් හා අණ හා මාණ්ඩලික කටයුතු පිළිබඳ පාඨමාලාවක් ද හදාරා ඇති අතර ඔහු චාටර්ඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් ලොජිස්ටික් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් ආයතනයේත් (Chartered Institute of Logistics & Transport) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරීත්ව ආයතනයේත් එක්සත් රාජධානියේ (Humanitarian Logistics Association) ආයතනයේත් සාමාජිකයෙකි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

### කළමනාකරණ මණ්ඩලය - ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

| | | |
|---|---|---|
| එස්.යූ.සුදසිංහ මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි | (2022.11.08 දක්වා) |
| පී.කේ. විජේරත්න මහත්මිය | තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමනාකාරිණී | (2022.11.02 දක්වා) |
| එම්.ඒ.වී.අයි. කුමාරසිරි මහතා | ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන | |
| ඩී.පී. අජිත් ලියනගේ මහතා | කළමනාකරු - කළමනාකරණ තොරතුරු පද්ධති | |
| පී.කේ.ආර්. ප්‍රනාන්දු මහතා | වාප්පු කළමනාකරු | |
| සී.එස්. විතානගේ මෙනවිය | කළමනාකරු - ම.මී.ගැ.ඒකකය | |
| ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය | ගණකාධිකාරිණී - ආදායම් | |
| | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය | (2022.11.27 දක්වා) |
| පී.ඒ.යූ. විජේවර්ධන මහත්මිය | නීති නිළධාරිණී - සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |
| පී.එම්.බී.ආර්. සෝමතිලක මහතා | නිෂ්පාදන කළමනාකරු | |
| ඒ.පී. හපන්ගම මහතා | ගණකාධිකාරී - මූල්‍ය ගිණුම්කරණ | |
| ඩී.පී.ඩී.ජේ. පුෂ්පකුමාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන | |
| එල්.ඩබ්ලිව්. දමයන්ති මහත්මිය | ගණකාධිකාරිණී - වැටුප් හා වේතන | |
| එම්.ඒ. එස්. කරුණාරත්න මහත්මිය | ගණකාධිකාරිණී - රාජ්‍ය ඔසුසල | |
| ඩී.කේ.ඒ.පී. දසනායක මහතා | පරිපාලන කළමනාකරු | |
| කේ.ඩී.එෆ්.එන්.පෙරේරා මහතා | විකුණුම් කළමනාකරු | |
| බී.ඒ.කේ. මදුසංක මහතා | කළමනාකරු - මානව සම්පත් | |
| ඩී.ඩී.එස්. තරංගමාලා මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන | |
| ආර්.පී. විතානගේ මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන | |
| කේ.පී.එස්. පෙරේරා මහත්මිය | ගණකාධිකාරිණී - ගෙවීම් | |
| එම්.ඒ.ඩී.එස්.එස්. මුණසිංහ මහතා | කළමනාකරු - ආනයන | |
| සී.යූ.එම්.එම්. බණ්ඩාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන | |
| එම්.කේ.සී. ක්‍රිශාන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | |
| ඩබ්ලිව්. ජයන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | |
| එම්.ආර්.එම්. රිෆ්කාන් මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | (2022.08.15 දක්වා) |
| | කළමනාකරු - ආනයන | (2022.08.16 සිට) |
| ටී.එම්.එච්.එන්.ටී.කේ. ඒකනායක මහත්මිය | කළමනාකරු - තාක්ෂණ | |
| එච්.එන්.ජේ.ඉදුනිල් මහතා | අභ්‍යන්තර විගණක | |
| ඩබ්ලිව්.ඒ ටී. ප්‍රේමවර්ධන මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | (2022.01.09 දක්වා) |
| | කළමනාකරු - ආනයන | (2022.01.10 සිට 2022.08.15 දක්වා) |
| | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | (2022.08.16 සිට) |
| අයි.පී.ඩබ්ලිව්.එස්. විමලසේන | කළමනාකාරිණී - පර්යේෂණ හා නව ව්‍යාපෘති | |
| පී.ඒ.එස්. පතිරන මහතා | ගණකාධිකාරී - තොග හා මිල කිරීම් | |
| ටී.කේ.පී.ඒ. ප්‍රියදර්ශණි මහත්මිය | කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක | |
| ඩබ්ලිව්.කේ.එම්.එස්. වන්නිආරච්චි | කළමනාකරු - පසුබෙදාහැරීමේ කටයුතු | (2022.01.03 සිට) |
| එස්.එම්.එන්.එන්. චතුරංග | විකුණුම් කළමනාකරු | (2022.02.14 සිට 2022.11.11 දක්වා) |

## සභාපතිතුමාගේ ප්‍රකාශනය



2022 වසර සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද විශාල භාග්‍යයක් ලෙස සලකමි.

ඖෂධ සංස්ථාවේ වසරේ පිරිවැටුම වූ රු. මිලියන 50,918 ට සාපේක්ෂව 2021 වසරේ පිරිවැටුම රු මිලියන 80,300 ක් වූ අතර එයට කොවිඩ් එන්නත් හා ඒ ආශ්‍රිත අයිතම අලෙවි ආදායම ද ඇතුලත් විය. රට තුළ පැවති විදේශ විනිමය ගැටළු හේතුවෙන් අපගේ ආනයන සීමාවූ මෙම වසර ඉතා අභියෝගාත්මක වසරක් විය. බැංකු සියල්ල ආන්තික සීමා පැනවීම් ඇතුළු පාලන කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය.

දේශීය වෙළඳපළ තුල අත්‍යවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ඖෂධ සංස්ථාවේ විවෘත වෙළඳපළ ක්‍රියාකාරකම් සඳහා ඉන්දියානු ණය මාර්ග පහසුකම භාවිතා කරන ලදී. ආනයන කටයුතු වලදී දීර්ඝ මෙන්ම නව ක්‍රියාවලියක් වූ මෙය ජූනි මස මැද භාගයේ සිට හඳුන්වා දෙන ලදී. කෙසේවුවත්, මෙම යාන්ත්‍රණය මඟින්, විදේශ විනිමය ද්‍රවශීලතා ගැටළුව යම් ප්‍රමාණයකට අවම කර ගැනීමට සංස්ථාවට හැකි විය.

අවසාන වශයෙන්, සියලු දුෂ්කරතා මධ්‍යයේ, රු. මිලියන 854 ක සමස්ත ලාභයක් වාර්තා කරමින් ලාභදායී ආයතනයක් ලෙස ඉදිරියට යාමට 2022 වසරේ ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාවට හැකිවිය.

2022 වසරේදී, ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාවේ විවෘත වෙළඳපළ ක්‍රියාකාරකම් තුලින් රු. මිලියන 479 ක බදු පෙර ලාභයක් වාර්තා කරගත් අතර එය 2021 වසරේ දී රු. මිලියන 705.9 ක් විය.

ලාභදායී රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වෙමින්, වෛද්‍ය සැපයුම් අංශය වෙත කළ සැපයුම් වෙනුවෙන් මුදල් ලැබීමේ ප්‍රමාදයන් හා ලැබියයුතු හිඟ මුදල් තිබියදීත් ලාභාංශ වශයෙන් රු. මිලියන 350 ක් මහාභාණ්ඩාගාරයට ලබාදීමට අපට හැකි විය. එයට අමතරව රු. මිලියන 1,380 ක් ආදායම් බදු හා අධිභාර බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලදී.

රටේ ජනතාවට දැරිය හැකි මිලට තත්ත්ව සහතික කළ සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන ලබාදී "ජනතාවට සේවය සැපයීම" අපගේ මෙහෙයුමේ ප්‍රධාන අරමුණයි.

මා හට ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, විගණකාධිපතිතුමා හා එම කාර්යමණ්ඩලයටත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, කළමනාකාර අධ්‍යක්ෂතුමා හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටත්, කළමනාකරණ මණ්ඩලයට හා සංස්ථාවේ සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින්ටත් මගේ කෘතඥතාව පුදකිරීමට කැමැත්තෙමි.

ඉදිරි වසර වලදී මාතෘ භූමියට වැඩි දායකත්වයක් ලබා දීමට අපට හැකිවනු ඇතැයි අපගේ විශ්වාසය හා බලාපොරොත්තුව වේ.



......................................

**සරත් ලියනගේ**
**සභාපති**

## කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



2022 වර්ෂය සඳහා සංස්ථාවේ කාර්‍ය සාධනය පිළිබඳ කළමනාකාර අධ්‍යක්ෂකගේ සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සෞඛ්‍ය ආරක්ෂක අයිතම ආනයනය කරනු ලබන ප්‍රමුඛ ආයතනයකි. රජයේ රෝහල් වෙත තත්ත්ව සහතික කළ ගුණාත්මක ඖෂධ හා ශල්‍ය උපකරණ අඛණ්ඩව සැපයීම තහවුරු කිරීම සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂක අයිතම සැපයීම සිදුකරයි. එයට අමතරව ඖෂධ නීතිගත සංස්ථාව උතුරු හා නැගෙනෙහිර පළාත් ද ආවරණය වන පුළුල් හා ශක්තිමත් බෙදාහැරීමේ ජාලය හරහා ඖෂධ ආනයනය කර දිවයින පුරා බෙදාහැරීම ද සිදුකරයි.

### මූල්‍ය කාර්යසාධනය

### සමස්ත මූල්‍ය කාර්යසාධනය

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මෙම වසරේ රු. මිලියන 50,918 ක පිරිවැටුමක් වාර්තා කර ගන්නා ලදී. ආර්ථික, මූල්‍ය හා දේශපාලනික සාධක වල අහිතකර බලපෑම නිසා 2022 වසර අභියෝගාත්මක වසරක් විය. කොවිඩ් එන්නත් හා ඒ ආශ්‍රිත අයිතම ඇතුලත් පෙර වසරේ පිරිවැටුම වූ රු. මිලියන 80,300 ට සාපේක්ෂව වර්ධනයක් වාර්තා නොවුනි.

2022 වසරේ දී ඖෂධ නීතිගත සංස්ථාවේ බදු පෙර ලාභය රු.මි.854 ක් විය. පෙර වසරේ වාර්තා වු රු.මිලියන 3,198 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී එය සැලකිය යුතු පහළ බැසීමකි. දිවයිනේ පැවති විදේශ විනිමය ගැටළුව සංස්ථාවේ පිරිවැටුම හා බදු පෙර ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. අත්‍යවශ්‍ය ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂක අයිතම ආනයනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ මෙම තත්ත්වය ඉන්දියානු ණය ක්‍රමවේදය (Indian Credit Line) මඟින් යම් තාක්දුරට කළමනාකරණය කර ගැනීමට හැකිවිය.

### රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම්

ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂක අයිතම අඛණ්ඩව සැපයීම සහතික කරලීම සඳහා අරමුදල් සපයා ගැනීමට රජයේ භාණ්ඩාගාරය සමඟ නිතිපතා සාකච්ඡා කිරීමට සිදුවූ අතර 2021 වසරේ සපයන ලද වටිනාකම වන රු.මිලියන 70,853 ට සාපේක්ෂව වෛද්‍ය සැපයුම් අංශයට මෙම වසරේ සපයන ලද ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂක අයිතම වල වටිනාකම රු. මිලියන 40,973 ක් විය. මෙය 42% ක පහත වැටීමකි. සැපයුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රට තුළ පැවති විදේශ විනිමය ගැටළුවයි.

සළකා බලන වර්ෂයේදී, රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම් මත බදු පෙර ලාභය රු. මිලියන 375 වූ අතර මෙය 2021 වසරේ වාර්තා කරගත් බදු පෙර ලාභය වූ රු. මිලියන 2,450 හා සසඳන කල සැලකිය යුතු පහත වැටීමකි.

රජයේ බැංකුවල විදේශ මුදල් ගිණුම් දෙකක් හා ආන්තික ගිණුමක් විවෘත කල අතර අත්‍යවශ්‍ය ඖෂධ තොග පවත්වා ගෙනයාම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට ඖෂධ සැපයීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ඉන්දියානු ණය පහසුකම භාවිතා කරන ලදී. ආයතන කිහිපයකින් අනුමැතිය ලබා ගත යුතු දීර්ඝ ක්‍රියාවලියක් සහිත නව ආනයන ක්‍රමවේදයක් වූ මෙය ජූනි මස මැද දී හඳුන්වා දෙන ලදී.

### විවෘත වෙළඳපල ක්‍රියාකාරකම්

2022 වසරේදී විවෘත වෙළඳපල ක්‍රියාකාරම් තුලින් ලද පිරිවැටුම රු. මිලියන 9,945 ක් වූ අතර එය 2021 වසරේ වාර්තා කරගත් රු. මිලියන 9,446 හා සැසඳීමේදී 5.3% ක වර්ධනයක් විය. රාජ්‍ය ඔසුසල වල විකුණුම් වර්ධනය මෙම පිරිවැටුමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවිය.

### බදුකරණය

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රාජ්‍ය භාණ්ඩාගාරයට ආදායම් බදු හා අධිභාර බදු වශයෙන් රු. මිලියන 1,380 ක් මෙම වසරේ ගෙවා ඇත. එම බදු වලට අමතරව, රු මිලියන 350 ක් භාණ්ඩාගාර අයබදු/ ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට ගෙවන ලදී.

### විකුණුම් හා වෙළඳ ප්‍රවර්ධනය

2022 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් නව රාජ්‍ය ඔසුසල දෙකක් හෝමාගම හා නිට්ටඹුව නගර වල පිහිටුවන ලදී. වර්ෂය අවසානයේ දී ඖෂධීය නාමයෙන් යුතු SPC ඖෂධ බෙදාහැර ජනතාවට වඩාත් එලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ බෙදාහැරීම් ජාලය සතුව, රාජ්‍ය ඔසුසල 51 ක්, බෙදාහරින්නන් 51, වරලත් වෙළඳුන් 111 ක් හා ප්‍රාදේශීය ගබඩාවක් දිවයින පුරා ක්‍රියාත්මකව පැවතුනි.

## තාක්ෂණ හා රසායනාගාර

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රසායනාගාරයේ ගුණාත්මක භාවය වර්ධනය කර ගනිමින් ඉහල මට්ටමකින් පවත්වාගෙන යාමට තවදුරටත් කැපවන අතර සංස්ථාවේ ඖෂධ සෑම විටම ගුණාත්මක භාවයෙන් පවත්වාගෙන යාම සඳහා "ටෙන්ඩර් නියදි පරීක්ෂාව", "නැව්ගත කිරීමට පෙර ලබාගත් නියැදි පරීක්ෂාව", "බෙදාහැරීමට පෙර නියදි පරීක්ෂාව" සහ මහජනතාව වෙත බෙදාහැරීමෙන් පසු "වෙළඳපල පැමිණිලි මත නියැදි පරීක්ෂාව" යන අදියර හතරක් යටතේ පරීක්ෂාවට ලක්කරයි.

## මානව සම්පත් සංවර්ධනය

සලකා බලන වර්ෂය අවසානයේ දී අපගේ මුළු ශ්‍රම බලකාය 919 ක්වූ අතර සමහර වාර්ෂික උත්සව අංගයන් අතහැර දැමීමට සිදු වුවද, සංස්ථාවේ 2021 වසරට පෙර පැවති සේවක සුභසාධන ප්‍රතිලාභ 2022 වසරේ දී ද සේවකයන් වෙත ලබා දෙන ලදී.

## ආයතනික සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීමෙහි කොටසක් ලෙස වසර 5 ට අඩු දරුවන්, ගැබිනි මව්වරුන්, වයස 55 ට වඩා වැඩි වැඩිහිටියන් මිලදී ගන්නා ඖෂධ වෙනුවෙන් 5% ක වට්ටමක් ලබාදීම මෙම වසරේදීත් සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

## අනාගතය

SPC "උසස් තත්ත්වය සහතික කල ආරක්ෂාකාරී හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවය සැපයීම" වන තම ප්‍රමුඛ අරමුණ සාර්ථක කරගනිමින් ලාභ උපයන ආයතනයක් ලෙස පවත්වා ගෙනයාම සංස්ථාවේ අරමුණයි.

## ස්තුතිය

සංස්ථාවේ සභාපතිතුමාටත් වාර්තා කරගත් ප්‍රතිපල ලඟාකර ගැනීම සඳහා කැපවීමෙන් සේවය ලබාදුන් සමස්ථ කළමනාකාරීත්වයට හා සියලුම අංශවල කාර්‍ය මණ්ඩල වලට ස්තූතිය පුදකිරීමට මෙය අවස්ථාව කරගන්නා අතරම මෙම වසරේ මා හට ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට, සෞඛ්‍ය අමාත්‍යංශයේ නිලධාරීන්ට හා මුදල් අමාත්‍යංශයට, මාගේ ස්තූතිය පුදකිරීමට කැමැත්තෙමි.



..........................................

**වෛද්‍ය එම්.වයි.කේ. විල්ෆ්‍රඩ්**

**කළමනාකාර අධ්‍යක්ෂ**

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

### ආරම්භය

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 වන දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවන ලදී.

### ගණකාධිකරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක 18 සිට 30 දක්වා ඉදිරිපත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවීය.

### අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මේ සංකල්පය පදනම්ව මූල්‍ය වාර්තා පිළයෙල කරන අතර ඉදිරියේ දී සිය මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ.

### ප්‍රතිඵල

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

### ව්‍යාපාර සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනයෙහි ඇතුලත් කර ඇත.

### දේපළ, පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපළ, පිරියත හා උපකරණ වල සිදුවූ වෙනස්කම් සටහන් අංක 16 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොල වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල මූලික වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

### සංචිත

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල වටිනාකම හා එහි සංයුතිය දක්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

2022 දෙසැම්බර් 31 වන දිනට පත්ව සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සරත් ලියනගේ මහතා | සභාපති | (2022.07.11 සිට) |
| වෛද්‍ය එම්.වයි.කේ. විල්ෆ්‍රඩ් | කළමනාකාර අධ්‍යක්ෂ | (2022.07.11 සිට) |
| වෛද්‍ය චින්තක ද සිල්වා | අධ්‍යක්ෂ | (2022.09.02 සිට) |
| වෛද්‍ය ආර්.එම්.ඩී. මැදගෙදර | අධ්‍යක්ෂ | (2022.09.02 සිට) |
| ටී.ඒ.රත්නසීල මහතා | අධ්‍යක්ෂ | (2022.03.23 සිට) |

**විගණන කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත. විගණන කමිටු වාර්තාව පිටු අංක 12 හි දක්වා ඇත.

**සේවා නියුක්තිය**

සේවකයන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියා මාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ දැනුම හා විශ්වාසයේ පරිදි රජයට සහ සේවකයන් හට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් යාවත්කාලීන කර ඇතිබවට උපරිමයෙන් සෑහීමකට පත්වේ.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත්වී නොමැත.

**රජයට දායකත්වය**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ආදායම් බදු හා අධිභාර බදු ලෙස රු. මිලියන 1,380 ක් රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවා ඇත. මෙම බදු වලට අමතරව භාණ්ඩාගාර අයබදු ලෙස රු. මිලියන 350 ක් ද රජයේ භාණ්ඩාගාරයට ගෙවා ඇත.

**සංයුක්ත සමාජමය වගකීම**

සමාජමය වගකීම් ලෙස සලකා සංස්ථාව විසින් රු. 495,596/- ක ප්‍රදානයන් ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදුකර ඇත.

**සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු**

මූල්‍ය වාර්තාවේ සටහන් අංක 35 යටතේ සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙළිදරව් කර ඇත.

**ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂපත්‍ර දිනට පසු ගිණුම් මඟන් ගැලපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තාවී නොමැත.

**විගණකවරුන් පත්කිරීම**

1971 මුදල් පනතේ විධිවිධාන අනුව, රජයේ විගණකාධිපතිතුමා සංස්ථාවේ විගණකවරයා වන අතර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්ෂික විගණනය සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත

..............................

**අනුරාධා විජයවර්ධන**
**නීති නිළධාරිණි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

## විගණන කමිටුවේ වාර්තාව

### විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකු ඇතුලත් වන අතර කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය තුල පහත සාමාජිකයන් විගණන කමිටුවට සහභාගී විය.

| | | |
|---|---|---|
| ඊ.ඒ රත්නසීල මහතා | - | සභාපති |
| හිරන්‍යා ද මෙල් මහතා | - | සාමාජික (2022.06.22 දක්වා) |
| වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා | - | සාමාජික (2022.06.22 දක්වා) |
| වෛද්‍ය දුෂාන්ත මැදගෙදර | - | සාමාජික (2022.12.29 දක්වා) |

සෞඛ්‍ය අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී තුමිය (22.06.2022 දින දක්වා) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක තුමිය (29.12.2022 දින සිට) හා රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාවේ ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීතුමා නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී විය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තුමිය හා අභ්‍යන්තර විගණක විගණන කමිටු ලේකම් හා කැඳවුම්කරු ලෙස පිළිවෙලින් කටයුතු කරන ලදී.

### විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කාර්ය වනුයේ සංස්ථාවේ පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සමාලෝචනයන් හා නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීමත් වේ. සමාලෝචිත වර්ෂය තුලදී කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදී.

01. අභ්‍යන්තර විගණන සැලසුම් ඇගයීම, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හි සංශෝධනය කිරීමට නිර්දේශ කිරීම.
02. 2022 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.
03. පැනනැගී ඇති කරුණු වල ස්වභාවයත්, අදාල කරුණු වලට කළමනාකරණයේ ප්‍රතිචාරයන් හා අභ්‍යන්තර විගණකගේ නිර්දේශත් ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබාදීම.
04. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13(7) ඒ සහ 14(2) සී වගන්ති ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවන්හි දක්වා ඇති කරුණු සමාලෝචනය කොට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දීම.
05. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

### විගණන කමිටුවේ නිර්දේශ

විගණන කමිටුවේ මග පෙන්වීම යටතේ, සමාලෝචිත වර්ෂය තුලදී අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද අතර විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාවල හා අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද වාර්තාවල දක්වා ඇති අඩුපාඩු හා මූල්‍යමය අලාභයන් හා වංචා පිළිබඳව නිසි පියවර ගැනීමටත් සංස්ථා කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල නිර්දේශ ලබාදෙන ලදී. තවද අභ්‍යන්තර විගණන අංශයේ පද්ධති හා මූල්‍ය විගණන ක්‍රියා මාර්ග තුලින් අකාර්යක්ෂම පිළිවෙත් බැහැර කිරීමටත්, අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමටත් වංචා අවම කර ගැනීමටත් කටයුතු කරන ලදී.

### රැස්වීම්

2022 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලද අතර එහිදී හඳුනා ගන්නා ලද අඩුලුහුඩුකම් හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. එම අඩුලුහුඩුකම් හා නිර්දේශ පිළිබඳව ඉදිරිපත් කරන ලද කමිටුවේ අදහස් ද සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීම සඳහා වන නිසි ක්‍රියාමාර්ග ගැනීමට ඉහළ කළමනාකාරිත්වය වඩා වගකීමෙන් හා විනිවිද භාවයෙන් යුතුව කටයුතු කළ යුතුව තිබූ බව නිරීක්ෂණය කරමි.



..............................................

**ඊ. ඒ. රත්නසීල**
**විගණන කමිටුවේ සභාපති**

## ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ආයතනයක් විසින් සියලූ පාර්ශවකරුවන්ගේ යහපත වෙනුවෙන් ආයතනයේ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම, මෙහෙයවීම සහ පාලනය සඳහා ආයතන යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලබන සමස්ත පද්ධතියයි. ආයතනික පාලනය සම්බන්ධ මූලික වගකීම සංස්ථාවේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබයි.

### අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් සමඟ ඉහලම වෘත්තීය සහ පුද්ගලික ආචාරධර්ම සහ වටිනාකම් තිබිය යුතුවේ.

- අමාත්‍යතුමා විසින් තීරණය කළ මනා පරිචයක් හා සුදුසුකම් ඇති පුද්ගලයින් අතුරෙන් සභාපතිතුමා හා තවත් අධ්‍යක්ෂවරු 5 දෙනෙකු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත්කරනු ලබයි.
- මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු මුදල් අමාත්‍යංශය විසින් නම් කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකාරිත්වයට රැස්වීම් වලදී සාකච්ඡා කිරීමට අවශ්‍ය සියලුම ප්‍රධාන සහ උපාය මාර්ගික තොරතුරු සකස් කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා දීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින නියම කරන අතර අධ්‍යක්ෂවරුන්ට සෑම රැස්වීමකටම අවම වශයෙන් දින හතකට පෙර න්‍යාය පත්‍රය හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලබාදී අන්තර්ගතය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙයි. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබාදීමට අවශ්‍යවූ විට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැඳවීම මත අංශ ප්‍රධානීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වේ.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහයක් කැඳවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

| **නම** | **තනතුර** | **පත්වීම් කාල සීමාව** | **පැමිණීම** |
|---|---|---|---|
| සරත් ලියනගේ මහතා | සභාපති | 2022.07.11 සිට මේ දක්වා | 3/10 |
| වෛද්‍ය එම්.වයි.කේ.විල්ෆ්‍රඩ් | කළමනාකාර අධ්‍යක්ෂ | 2022.07.11 සිට මේ දක්වා | 3/10 |
| වෛද්‍ය ආර්.එම්.ඩී.මැදගෙදර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2022.09.02 සිට මේ දක්වා | 3/10 |
| ඊ.ඒ. රත්නසීල මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2022.03.23 සිට මේ දක්වා | 9/10 |
| වෛද්‍ය චින්තක ද සිල්වා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2022.09.02 සිට මේ දක්වා | 3/10 |
| **ඉවත්වී ඇත** | | | |
| වෛද්‍ය යූ.ඩී.එස්. සමරසිංහ මහතා | වැඩබලන සභාපති | 2021.12.03 සිට 2022.07.09 දක්වා | 7/10 |
| වෛද්‍ය යූ.ඩී.එස්. සමරසිංහ මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2021.11.15 සිට 2022.03.31 දක්වා | 5/10 |
| වෛද්‍ය අයි.පී.හල්පගේ මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | 2022.04.01 සිට 2022.07.09 දක්වා | 2/10 |
| හිරන්‍යා ද මෙල් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2020.01.29 සිට 2022.08.31 දක්වා | 7/10 |
| වෛද්‍ය ඒ.කේ. එස්.බී. ද අල්විස් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2020.01.29 සිට 2022.07.05 දක්වා | 7/10 |
| මහාචාර්ය බී. ඩී. ගමගේ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2020.12.17 සිට 2022.09.06 දක්වා | 6/10 |
| එච්.ජී.බී.එස්.ගුණරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2020.01.29 සිට 2022.08.31 දක්වා | 5/10 |
| එම්.ආර්.වී.ආර් මීපුර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 2021.03.02 සිට 2022.03.07 දක්වා | 1/10 |

### කළමනාකරණ කමිටුව

කළමනාකරණ කමිටුව සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත වන අතර සභාපතිවරයා විසින් සභාපතිත්වය උසුලයි. කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද සියලූ ප්‍රතිපත්තිමය කරුණු හොඳින් විමසා බලන අතර අනුමැතිය හා එකඟතාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට පෙර ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමද නිරීක්ෂණය කරයි. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට හා ප්‍රමාදයන් වළක්වා ගැනීමට කළමනාකරණ කමිටුව මාසිකව රැස්වී තීරණ ගනියි. වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත.

### විගණන කමිටුව

"යහපාලනය සඳහා පොදු ව්‍යපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි.

සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව සිදුකරන අතර විගණකාධිපති තුමාද දැනුවත් කර විගණන කමිටුවේ අනුමැතියෙන් පිළියෙල කරන අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කරයි.

අභ්‍යන්තර විගණක වාර්තා සහ රජයේ විගණන වාර්තා පිළිබඳ විගණන කමිටු සමාලෝචනය සහ ඔවුන්ගේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කෙරෙන බවට පසු විපරම් කිරීමත්, මූල්‍ය හා මෙහෙයුම් දෙඅංශයේම අවදානම් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් සහ යාන්ත්‍රණයක් සංස්ථාව සතුව ඇති බවටත්, එම අවදානම හොඳින් අර්ථ දක්වා ඇති ක්‍රියාකාරී සැලැස්මක් හරහා කළමනාකරණය කරන බවටත් විගණන කමිටුව සහතික කරයි.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී.

| සාමාජිකයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|
| ඊ.ඩී. රත්නසීල මහතා | සභාපති | 3/3 |
| හිරන්‍යා ද මෙල් මහතා | සාමාජික | 2/3 |
| වෛද්‍ය ඩී.කේ. එස්.බී. ද අල්විස් මහතා | සාමාජික | 2/3 |
| වෛද්‍ය ආර්.එම්.ඩී.මැදගෙදර මහතා | සාමාජික | 1/3 |

### වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත සකසා ඇති අතර දැනට ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව 2020.07.01 සිට 2023.06.30 දක්වා කාලය සඳහා සාමූහික ගිවිසුමකට එළඹ ඇත.

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සංස්ථා අධ්‍යක්ෂවරුන්ගේ දීමනා සහ වරප්‍රසාද වලට අදාළ චක්‍රලේඛ වලට අනුව අධ්‍යක්ෂ වරුන්ගේ දීමනා හා වරප්‍රසාද තීරණය කරන අතර මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 අංක 2 දරන චක්‍රලේඛය මත පදනම්ව සංස්ථාව විසින් සකස් කල වැටුප් පරිමාණයන් මත සේවක වැටුප් ගෙවනු ලබයි.

කාර්යසාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සැපුවම කාර්ය සාධනය හා සම්බන්ධව ක්‍රියාත්මක කරයි.

### අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් ආවරණය වන කාල සීමාව තුළ ක්‍රියාත්මක වූ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය සහ මෙම වාර්තාව හා යාවත්කාලීනව සමාලෝචනය කර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කරයි.

ගනුදෙනු වල විනිවිද භාවය පවත්වා ගැනීමටත් එමගින් අදාල පාර්ශවයන්ට සමාන අවස්ථා ලබාදීම සඳහා සංස්ථාව විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන වියදම් ද ඇතුලත් වාර්ෂික අයවැය සෞඛ්‍ය අමාත්‍යංශය හා මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරයි.

රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව, සංස්ථාවේ අවදානම් පැතිකඩ හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා අවදානම් කමිටුවක් පත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ මූලික අවධානය යොමු වන්නේ අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මක භාවය, අඛණ්ඩතාව සහ සඵලතාවය ඇගයීම මගින් සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදුකිරීමත්, අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා කළමනාකාරීත්වයට නිර්දේශ ලබාදීමත් වේ. අභ්‍යන්තර විගණනය මගින් සංස්ථාවේ අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, සඵලතාවය, නීති හා රෙගුලාසි, ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වලට අනුකූලවීම පිළිබඳව සභාපතිවරයා වෙත නිරන්තරයෙන් වාර්තා කරයි.

### ප්‍රධාන කොටස්කරුවා හා හිමිකරු ලෙස රජයට වගවීම

සංස්ථාව විසින් සාක්ෂාත් කර ගත යුතු පැහැදිලි මාර්ගෝපදේශ සහ උපාය මාර්ගික අරමුණු සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මඟ පෙන්වන ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්තුමා සමඟ නිරන්තරයෙන් අදහස් හුවමාරු කර ගන්නා අතර වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තුමය කාර්යසාධන වාර්තා සෞඛ්‍ය අමාත්‍යංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට අමතරව, මුදල් අමාත්‍යංශයේ මහා මහාණ්ඩාගාරයට අවශ්‍ය පරිදි, සංස්ථාව විසින් වසර තුනක ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරයි.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වර්තමාන කාර්යසාධනය ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කරයි.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

1971 අංක 38 දරන මුදල් පනත යටතේ, සංස්ථාවේ සියලුම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් වාර්තා තබා ගැනීම සහ වසරේ ලාභාලාභ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත්ව ගිණුම් වාර්තා පවත්වා ගැනීමට සංස්ථාව මෙහෙයවා ඇති අතර ඔවුන්ගේ නිරන්තර රැස්වීම් වලදී හා විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරන පද්ධතිය සමාලෝචනය කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සාධාරණ හා විචක්ෂණ තීරණ හා ඇස්තමේන්තු කිරීම් පදනම් කර ගෙන සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ වෙනත් අක්‍රමිකතා වැලැක්වීමට හා අනාවරණය කර ගැනීමට ඔවුනට සාධාරණව හෙළිදරව් වන පරිදි පියවර ගෙන ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් ප්‍රායෝගිකව අපගේ වාර්තා වල නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ආරක්ෂා කර ගනිමින් සංස්ථාවේ කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පරීක්ෂාව, අභ්‍යන්තර විගණනය, මූල්‍ය සහ අනෙකුත් පාලනයන්ගෙන් සමන්විත ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග මත**

................................

**අනුරාධා විජයවර්ධන**
**නීති නිළධාරිණී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31වන දිනට | සටහන | 2022 රු. | 2021 (නැවත ප්‍රකාශිත) රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 16 | 2,104,965,728 | 2,084,196,680 |
| භාවිත අයිතිය සහිත වත්කම් | 17 | 52,875,747 | 44,133,149 |
| සම්පූර්ණයෙන් ගෙවනලද කල්බදු වත්කම් | 18 | 21,286,748 | 22,064,222 |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | | 42,266,490 | 38,311,359 |
| අස්පෘශ්‍ය වත්කම් - මෘදුකාංග | 19 | 6,748,551 | 2,567,274 |
| විලම්බිත බදු වත්කම් | 20 | 237,125,035 | 160,331,877 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,465,268,298** | **2,351,604,561** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය - රා.ඖ.සං | 21 | 3,189,711,730 | 2,396,405,789 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග. | 22 | 40,000,547 | 936,743,053 |
| වෙළඳ හා වෙනත් ණයගැතියෝ | 23 | 54,916,912,501 | 52,164,442,205 |
| පෙරගෙවීම් | 24 | 50,797,070 | 41,905,706 |
| බැංකු හා අතැති මුදල් | 25 | 5,613,777,091 | 1,111,456,668 |
| **මුළු ජංගම වත්කම්** | | **63,811,198,939** | **56,650,953,422** |
| **මුළු වත්කම්** | | **66,276,467,238** | **59,002,557,982** |
| | | | |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | 31 | 59,055,258 | 59,055,258 |
| රඳවාගත් ඉපයුම් | | 14,388,557,344 | 14,007,731,669 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 71,350,931 | - |
| පොදු සංචිතය | 32 | 66,061,447 | 66,061,447 |
| **මුළු ස්කන්ධය** | | **14,585,024,980** | **14,132,848,373** |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 26 | 457,544,429 | 470,173,261 |
| දිගුකාලීන කල්බදු වගකීම් | 17.1 | 38,781,989 | 28,587,360 |
| දිගුකාලීන ණය | 27 | 7,508,388,884 | 9,405,711,108 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **8,004,715,302** | **9,904,471,729** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ණයහිමියෝ | 28 | 25,555,706,528 | 16,164,216,448 |
| ආදායම් බදු බැඳියාව | | 190,930,434 | 592,358,586 |
| අධිභාර බද්ද | | - | 692,831,420 |
| විලම්බිත ආදායම් | | - | 1,471,313 |
| කල්බදු වගකීම් | 17.1 | 23,252,962 | 21,759,130 |
| ජංගම මූල්‍ය වගකීම් | 29 | 15,937,903,698 | 15,432,056,540 |
| දිගුකාලීන ණය | 27 | 1,978,933,334 | 2,060,544,444 |
| **මුළු ජංගම වගකීම්** | | **43,686,726,956** | **34,965,237,880** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **66,276,467,238** | **59,002,557,982** |

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත පරිදි අත්සන් තබන ලදී.

23.12.30

| | | | |
|---|---|---|---|
| සරත් ලියනගේ | වෛද්‍ය එම්. වයි. කේ. විල්ෆ්‍රඩ් | කේ. එම්. ඩී. ආර්. දසනායක | හිරන්‍යා සම්මන්දප්පෙරුම |
| සභාපති | කළමනාකාර අධ්‍යක්ෂ | සාමාන්‍යාධිකාරී | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |

පිටු අංක 20 සිට 60 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස්වේ.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. | පොදු සංචිතය රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | ඒකාබද්ධ ලාභාලාභ ගිණුම රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 2020 ජනවාරි 01 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | - | 10,431,211,366 | 10,556,328,071 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | | 1,969,223,517 | 1,969,223,517 |
| (අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබියයුතු අමතර ගබඩා ගාස්තු අඩුවෙන් දැක්වීම නිවැරදි කලා (ශුද්ධ වටිනාකම) | | | | 18,029,245 | 18,029,245 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | | (191,755,485) | (191,755,485) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **-** | **12,226,708,643** | **12,351,825,348** |
| ( ආ) අඩුකලා: 2020/2021 වසරේ බදු ගෙවිය යුතු ආදායම මත අධිභාර බදු | | - | - | (692,831,419) | (692,831,419) |
| **2021 ජනවාරි 01 වන දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **-** | **11,533,877,223** | **11,658,993,928** |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | | 2,384,563,878 | 2,384,563,878 |
| (අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබියයුතු අමතර ගබඩා ගාස්තු අඩුවෙන් දැක්වීම නිවැරදි කලා (ශුද්ධ වටිනාකම) | | | | 31,852,134 | 31,852,134 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | | 57,438,433 | 57,438,433 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **-** | **14,007,731,669** | **14,132,848,374** |
| 2022 ජනවාරි 01 වන දිනට ශේෂය | 59,055,258 | 66,061,447 | - | 14,007,731,669 | 14,132,848,374 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | | |
| භාණ්ඩාගාර අයබදු ගෙවීම් | | | - | (350,000,000) | (350,000,000) |
| වසරේ ශුද්ධ ලාභය | | | - | 644,723,214 | 644,723,214 |
| දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන ලාභය (මෝටර් වාහන) | | | 71,350,931 | - | 71,350,931 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | - | 86,102,461 | 86,102,461 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **71,350,931** | **14,388,557,344** | **14,585,024,980** |

(ආ) 2020/2021 තක්සේරු වර්ෂයේ රු.මි.2,771 ක් වූ බදු ගෙවිය යුතු ආදායමෙන් සංස්ථාව රු.මි 692 ක අධිභාර බද්දක් ගෙවන ලද අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිර්දේශ කර ඇති ආකාරයට අධිභාර බදු ගිණුම් ගතකර ඇත.

(අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබියයුතු අමතර ගබඩා ගාස්තු වැරදි ලෙස අඩුවෙන් දැක්වීම නිවැරදි කලා

| | 2021 රු. | 2020 ට පෙර රු. | එකතුව රු. |
|---|---|---|---|
| වටිනාකම | 41,910,702 | 23,722,691 | 65,633,393 |
| බදු බලපෑම @ 24% | 10,058,569 | 5,693,446 | 15,752,014 |
| ශුද්ධ අගය | **31,852,134** | **18,029,245** | **49,881,379** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | ක්‍රියාකාරකම් ර.ඖ.ස 2022 රු. | ක්‍රියාකාරකම් ර.බෙ.ග 2022 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2022 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2021 (නැවත ප්‍රකාශිත) රු. |
|---|---|---|---|---|---|
| ආදායම | 7 | **9,945,849,118** | **40,973,117,489** | **50,918,966,607** | **80,300,077,329** |
| අඩුකලා | | | | | |
| සෘජු වියදම් - ර.බෙ.ග. | 8 | | 38,184,022,980 | 38,184,022,980 | 66,269,228,066 |
| විකුණුම් පිරිවැය - රා.ඖ.ස. | 9 | 7,758,197,644 | | 7,758,197,644 | 7,085,466,342 |
| නිෂ්පාදන පිරිවැය - ජීවනී ඒකකය | 10 | 118,067,057 | | 118,067,057 | 136,819,315 |
| **දළ ලාභය/ අතිරික්තය** | | **2,069,584,417** | **2,789,094,509** | **4,858,678,926** | **6,808,563,606** |
| එකතු කලා:- වෙනත් මෙහෙයුම් ආදායම් | 11 | 107,109,942 | - | 107,109,942 | 88,531,203 |
| අඩුකලා:- | | | | | |
| පරිපාලන වියදම් | 12 | 1,407,495,636 | 651,796,824 | 2,059,292,460 | 1,967,159,456 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 13 | 283,503,681 | 1,762,089,247 | 2,045,592,928 | 1,158,051,637 |
| **මෙහෙයුම් ලාභය** | | **485,695,041** | **375,208,438** | **860,903,480** | **3,771,883,716** |
| අඩුකලා: මූල්‍ය වියදම් | 14 | 14,113,863 | - | 14,113,863 | 580,180,147 |
| එකතුකලා: මූල්‍ය ආදායම් (සේවක ණය පොළී) | | 7,643,459 | - | 7,643,459 | 6,943,197 |
| **බදු වලට පෙර ලාභය** | | **479,224,638** | **375,208,438** | **854,433,076** | **3,198,646,765** |
| ආදායම් බදු වියදම | 15 | 117,619,665 | 92,090,196 | 209,709,862 | 782,230,754 |
| **බදු වලට පසු ලාභය** | | **361,604,972** | **283,118,242** | **644,723,214** | **2,416,416,011** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන ලාභය (මෝටර් වාහන) | | 35,675,465 | 35,675,465 | 71,350,931 | - |
| පාරිතෝෂික වෙන්කිරීම මත අතිරික්තය/ ඌනතාව | 26 | 37,885,083 | 48,217,378 | 86,102,461 | 57,438,433 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | **435,165,521** | **367,011,086** | **802,176,606** | **2,473,854,444** |

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | | **854,433,076** | **3,156,736,063** |
| **ගැලපීම්:** | | | |
| ක්ෂය කිරීම | 16 | 99,046,156 | 81,750,446 |
| ස්ථාවර වත්කම් අගය අඩුවීම්/ගැලපීම් | 16 | 4,226,358 | 6,640,642 |
| විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම | 26.3 | 95,592,723 | 73,805,510 |
| කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන | 18 | 777,474 | 777,474 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය/අලාභය | | (1,634,771) | (1,854,296) |
| මෘදුකාංග ක්‍රමක්ෂය | 19 | 1,299,862 | 816,860 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම | 7 | (7,013,753) | (9,068,148) |
| කල්බදු පොලිය ( ඔසුසල) | | 12,819,529 | 8,455,972 |
| භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය | | 28,712,905 | 26,149,892 |
| බොල්ණය අයකර ගැනීම් -රා.ඖ.ස. | 11 | 2,026,781 | (15,654,623) |
| බොල්ණය සඳහා වෙන්කිරීම -ර.බෙ.ග. | 13 | 605,449,009 | 493,742,965 |
| තොග අලාභ | 13 | 430,137 | 319,034 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- රා.ඖ.ස | 13 | 60,402,156 | 128,932,861 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- ර.බෙ.ග | 13 | 69,863,409 | 28,505,210 |
| පොලී වියදම් | 14 | 140,117 | 569,624,426 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **1,826,571,166** | **4,549,680,288** |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම | 23 | (3,359,946,085) | (18,896,724,637) |
| තැන්පතු සහ පෙරගෙවීම් වැඩිවීම/අඩුවීම | 24 | (8,891,364) | 59,011,369 |
| වෙළඳ තොග වැඩිවීම/අඩුවීම | | (847,124,481) | 234,508,319 |
| මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම | 22 | 826,879,098 | 349,508,241 |
| වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම | 28 | 9,391,490,080 | 33,180,124 |
| විලම්බිත ආදායම් වැඩිවීම/අඩුවීම | | (1,471,313) | (328,453) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | **7,827,507,101** | **(13,655,510,128)** |
| ආදායම් බදු ගෙවීම් | | (687,931,172) | (698,612,812) |
| අධිභාර බදු ගෙවීම් | | (692,831,419) | |
| භාණ්ඩාගාර අයබදු/ලාභාංශ ගෙවීම් | | (350,000,000) | |
| පාරිතෝෂික ගෙවීම් | 26 | (22,119,094) | (41,860,032) |
| පොලී ගෙවීම් | 14 | (140,117) | (569,624,426) |
| **විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය** | | **(1,753,021,802)** | **(1,310,097,270)** |
| | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **6,074,485,299** | **(14,965,607,397)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | 16 | (54,142,634) | (167,278,573) |
| නොනිම්වැඩ වැඩිවීම/අඩුවීම | | (3,955,131) | 82,355,726 |
| පරිගනක මෘදුකාංග | 19 | (5,481,140) | (583,471) |
| ස්ථාවර වත්කම් විකිණීම් | | 3,086,775 | 4,976,896 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය** | | **(60,492,131)** | **(80,529,422)** |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දිගුකාලීන ණය ගෙවීම් | 27 | (1,978,933,334) | (409,744,448) |
| කල්බදු වාරික ගෙවීම් | | (38,586,571) | (34,147,469) |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(2,017,519,905)** | **(443,891,917)** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ ශුද්ධ වැඩිවීම | | 3,996,473,264 | (15,490,028,737) |
| **වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **(14,320,599,871)** | **1,169,428,866** |
| | | | |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන- අ.)** | | **(10,324,126,608)** | **(14,320,599,871)** |

| සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ | | 2022<br>Rs. | 2021<br>Rs. |
|---|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | 25 | 5,613,777,091 | 1,007,854,541 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 25 | - | 103,602,127 |
| බැංකු අයිරාව | 29 | (15,937,903,698) | (15,432,056,540) |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **(10,324,126,607)** | **(14,320,599,871)** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. ආයතනික තොරතුරු

#### 1.1 පිහිටීම හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කර ඇති අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත. දැනට කොළඹ 5 "මෙහෙවර පියස" යන ස්ථානයේ සිට සිය මෙහෙයුම් ක්‍රියාත්මක කරයි.

#### 1.2. ගිණුම් කාලපරිච්ඡේදය

2022 ජනවාරි මස 1 වන දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාල සීමාව සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගිණුම් පිළියෙල කරයි.

#### 1.3. ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

අ. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම විවෘත වෙළඳ පොලට ආනයනය කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.

ආ. රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.

ඇ. ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් (B.B. Cream) ඇතුළු අයිතම ගණනාවක් නිෂ්පාදනය කර විකිණීම.

ඈ. රසායනාගාර පහසුකම් සැපයීම සහ ඖෂධ නියැදි පරීක්ෂාව.

### 2. පිළියෙල කිරීමේ පදනම

#### 2.1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට භාවිතා කරනලද මූලික ගණකාධිකරණ ප්‍රතිපත්ති සටහන් අංක 3 සිට 6 දක්වා ඉදිරිපත් කර ඇති අතර විශේෂයෙන් සඳහන් කර නොමැති විට ඒවා නියමාකාරයෙන් භාවිත කර ඇත. ඖෂධ සංස්ථාවේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට (සාමාන්‍ය ව්‍යවහාරයේ පරිදි "SLFRS"/ "LKAS") අනුකූලව පිළියල කර ඇත. මෙම මූල්‍ය වාර්තා වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයක්, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා සටහන් ඇතුලත් වේ.

#### අධිභාර බදු

2022 අංක 14 දරන අධිභාර බදු පනතෙන් පැනනගින බදු වගකීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ක්‍රියා මාර්ග ප්‍රකාශය (SOAT) මඟින් නිර්දේශිත පරිදි ගිණුම් ගත කර ඇති අතර සටහන් අංක 3.8.3 යටතේ හෙළිදරව් කර ඇත.

#### 2.2. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකශන සඳහා ඔවුන්ගේ වගකීම පිළිගන්නා අතර නිකුත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන වල කිසියම් සංශෝධන වේ නම් එය නිවැරදි කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

#### 2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය

2023 මාර්තු මස 9 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා බලය පවරන ලදි.

#### 2.4. මිණුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් පහත ද්‍රව්‍යමය කරුණු හැර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- ගෘහ භාණ්ඩ, උපකරණ හා පරිගණක නැවත තක්සේරු කර සාධාරණ වටිනාකම ලෙස ප්‍රත්‍යාග ණන වටිනාකමට දක්වා ඇත.
- විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ආයුගණක තක්සේරු වටිනාකමට දක්වා ඇත.

අවශ්‍ය අවස්ථාවලදී, අදාල නිශ්චිත ප්‍රතිපත්ති සටහන් මඟින් විස්තර කර ඇත.

#### 2.5. භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සංස්ථාවේ භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් සංස්ථාවේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

#### විදේශ මුදල් ගණුදෙනු හා ශේෂ

ගණුදෙනුව සිදුවූ දිනයේ පවතින විදේශ විනිමය අනුපාතයට (spot exchange rate) අනුව විදේශ මුදල් ගනුදෙනු සංස්ථාවේ ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලබයි. එවැනි ගනුදෙනු පියවීමෙන් හා වසර අවසානයේ දී විදේශ මුදලින් ඇති වටිනාකම් නැවත ක්‍රියාකාරී මුදල් ඒකකයට පරිවර්තනය කිරීමේදී ලැබෙන විදේශ විනිමය ලාභ හා පාඩු ලාභාලාභ ගිණුමේ හඳුනා ගනියි.

#### 2.6. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම හා සංසන්දනය පහසු කරලීම සඳහා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති සියලු වටිනාකම් වෙනුවෙන් ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා සවිස්තර සහිත පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු දක්වා ඇත. අවශ්‍ය අවස්ථාවලදී, ප්‍රවර්ථන වසරේ ඉදිරිපත් කිරීම් වලට අනුකූලව පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඇත.

## 2.7. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ - LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) දක්වා ඇති සෘජුක්‍රමය භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇති අතර මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාල දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් හඳුනාගෙන දක්වා ඇත.

## 2.8. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන.

මෙම ගිණුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී, සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති වලට සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වලට බලපාන තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන කළමනාකරණය විසින් ගන්නා ලදී. සත්‍ය ප්‍රතිඵලය එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා දක්වා ඇති උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට ලක් කරයි. ගිණුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන, අදාල සංශෝධන සිදුකරන වසර හා ඉදිරි කාලපරිච්ඡේද වලට අදාල වන පරිදි ගලපයි.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වටිනාකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිත තාවයන් පිළිබඳ තොරතුරු පහත සටහන් වලට ඇතුලත් කර ඇත.

| | | |
|---|---|---|
| සටහන 25 | - | විලම්බිත බදු වත්කම්/ වගකීම් හඳුනාගැනීම |
| සටහන 21 | - | අඩමාන ණය සඳහා වෙන්කිරීම |
| සටහන 24 | - | විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ඇගයීම මූලික ආයුගණක උපකල්පන |
| සටහන 18 | - | කල්බදු |
| සටහන 16 | - | උපකරණ, ගෘහ භාණ්ඩ, පරිගණක හා මෝටර් රථවල සාධාරණ අගය තක්සේරු කිරීම |

**වෙන්කිරීම් :** අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේ සංස්ථාවට නීතිමය හෝ වටහාගත හැකි බැඳීමක් ඇති විට, වියහැකි සම්භාවිතාව සලකා බලා විශ්වාසදායක තක්සේරුව මත පදනම්ව වෙන්කිරීම් සිදුකරයි.

## 2.9 සාධාරණ අගය තක්සේරු කිරීම

සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් ගණනාවක් සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තක්සේරු කිරීමට අවශ්‍යවේ. ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය මූල්‍ය වෙළඳපොල තුල සැලකිය යුතු අස්ථාවරත්වයකට හේතුවී ඇත. කෙසේ වුවද මූල්‍ය වෙළඳපොලෙහි අස්ථාවරත්වය හේතුවෙන් සංස්ථාවට තම මූල්‍ය වත්කම් කිසිවක් නැවත වර්ගීකරණය කිරීමට අවශ්‍යවී නොමැත.

සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් සහ තක්සේරුකරණ ගැලපුම් ද නිරන්තරයෙන් සමාලෝචනය කරයි. වෙළඳ වටිනාකම තක්සේරු කිරීම සඳහා තෙවන පාර්ශවයක තොරතුරු භාවිතා කරයි නම්, නිගමනයට සහාය වීම සඳහා තෙවන පාර්ශවයෙන් ලබාගත් සාක්ෂි එවැනි තක්සේරු කිරීම් වර්ගීකරණය කළ යුතු සාධාරණ අගය ධූරාවලියෙහි මට්ටම ද ඇතුලත් SLFRSs/LKASs හි අවශ්‍යතා සපුරන බවට සංස්ථාව නැවත තහවුරු කර ගනියි.

තවද, සැලකියයුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගනියි නම් : බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේදී වෙළඳපොල දැනුම, කීර්තිය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙනයන්නේ ද යන්න සළකා බලයි. බාහිර තක්සේරු කරුවන් සමඟ සාකච්ඡාකර, ඒ ඒ වත්කම සඳහා කුමන යෙදවුම් හා කුමන තක්සේරු ක්‍රමය භාවිතා කළයුතු ද යන්න සංස්ථාව තීරණය කරයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී, සංස්ථාව හැකි පමණ නිරීක්ෂණය කලහැකි වෙළඳපොල තොරතුරු භාවිතා කරයි. තක්සේරු කරණයේදී භාවිතා කල යෙදවුම් පදනම් කර ගනිමින් සාධාරණ අගය මට්ටම් ධූරාවලියෙහි මට්ටම් වලට වෙළඳ වටිනාකම වර්ගීකරණය කර දක්වන ක්‍රම පහත පරිදි වේ.

- මට්ටම 1 : සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපල වල මිල ගනන්

  (සකස් නොකළ)

- මට්ටම 2 : 1 වන මට්ටමට ඇතුලත් කර ඇති මිල ගණන් හැර වත්කම් හෝ වගකීම් සඳහා කෙලින්ම නිරීක්ෂණය කලහැකි වෙනත් යෙදවුම් (උදා : මිල ගණන්) හෝ වක්‍රාකාරව, (උදා : මිල ගණන් වලින් උපුටාගත්)

- මට්ටම 3 : වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ යෙදවුම්

  (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

වත්කමක හෝ වගකීමක වෙළඳපොල වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සාධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් වලට වැටේ නම්, සාධාරණ අගය මැනීම, සමස්ත අගය සඳහාම වැදගත් වන අවම ආදාන මට්ටම ලෙස සාධාරණ අගය ධූරාවලියේ එකම මට්ටමින් වර්ගීකරණය කර ඇත. සාධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් අතර මාරුකිරීම අදාල වෙනස සිදුවූ වර්ෂය අවසානයේ දී සිදුකරයි. ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට (OCI) ගණන් ගැනෙන වත්කම් කිසිවක් දැනට සංස්ථාව සතුව නොමැත.

# 3 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

## 3.1. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාව විසින් භාවිතා කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති විශේෂයෙන් දක්වා නොමැති විට පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුරූපවේ. ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අනුකුල වන පරිදි අවශ්‍ය අවස්ථාවල පෙර වර්ෂයේ සංඛ්‍යා හා වාක්‍ය ඛණ්ඩ නැවත සකසා ඇත.

### 3.2. අඛණ්ඩ පැවැත්ම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම තීරණය කිරීමේදී, රටේ පවත්නා ආර්ථික අර්බුධයෙන් සංස්ථාවට පවතින බලපෑම සහ අපේක්ෂිත බලපෑම් පවත්නා තොරතුරු පදනම්ව කළමනාකරිත්වය විසින් තක්සේරුකර දිගින් දිගට පැවැත්මේ සංකල්පය අනුව ගිණුම් පිළියෙල කිරීම යෝග්‍ය බව තීරණය කර ඇත.

ඖෂධ සැපයීමට සිදුවිය හැකි බාධා, ඉල්ලුමේ ඇතිවිය හැකි සැලකියුතු වෙනස්කම් හේතුවෙන් කාරක ප්‍රාග්ධනයට ඇතිවන බලපෑමත්, එමගින් ද්‍රවශීලතාවයට වන බලපෑමත් ඒ හේතුවෙන් මෙහෙයුම් දිගින් දිගටම පවත්වා ගෙන යාමට සිදුවන බලපෑමත් ආදී වශයෙන්වූ පුළුල් පරාසයක සාධක ඇගයීමෙන් පසු අපේක්ෂා කළහැකි අනාගත කාලයක් සඳහා මෙහෙයුම් පවත්වා ගෙනයාමට සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වූ අතර දිගින් දිගට පවත්වා ගෙනයාමේ පදනමට අනුව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීමට තීරණය කෙරිණි.

ඉහත සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන නිර්ණය කිරීමේදී පවත්නා ආර්ථික අර්බුධයේ බලපෑම වාර්තා කරන දිනය තෙක් සලකා බලා ඇති අතර අදාල නිශ්චිත කරුණු සටහන් යටතේ අනාවරණය කර ඇත.

### 3.3. වසර තුල නිකුත් කරනු ලැබූ නව ගණකාධිකරණ ප්‍රමිත/ දැනට පවතින ගණකාධිකරණ ප්‍රමිත වල සිදුවූ වෙනස්කම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නව ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කර නොමැත. පහතින් දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා 2023 ජනවාරි 1 වන දිනට පසු බලපැවැත්වූ සංශෝධන මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු නොකරයි.

- LKAS 1 සඳහා වූ සංශෝධන
- IFRS 17 රක්ෂණ කොන්ත්‍රාත්
- LKAS 12 විලම්බිත බදු සඳහා වූ සංශෝධන
- LKAS 8 සඳහා වූ සංශෝධන

### 3.4. දේපල, පිරියත හා උපකරණ

#### 3.4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ හඳුනා ගනු ලබන්නේ අදාල වත්කම හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව තුලට ගලා එන්නේ නම් හා වත්කමේ පිරිවැය නිශ්චිතව ගණනය කළ හැකි නම් පමණි.

#### 3.4.2. මිණුම් පදනම

ගෘහභාණ්ඩ, උපකරණ හා පරිගණක හැර දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැය/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩුකල පසු වටිනාකමට වේ. එබඳු පිරිවැය අගයන්ට දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් වූ උපාංග ප්‍රතිස්ථාපන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැයද ඇතුලත් වේ.

#### පසුකාලීන පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල උපාංග නැවත ස්ථාපිත කිරීමේ පිරිවැය එම අයිතමයේ පිරිවැය ලෙස හඳුනා ගනු ලබන්නේ එම කොටසට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමට සම්භාවිතාව පවතී නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් වේ. ඉවත් කල උපාංගයේ ධාරණ අගය හඳුනා ගැනීමෙන් ඉවත් කරයි. අනෙක් සියලුම අලුත්වැඩියා හා නඩත්තු වියදම් දරනු ලබන පරිදි ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනියි.

#### පිරිවැය ආකෘතිය

උපකරණ, ගෘහ භාණ්ඩ සවිකිරීම්, පරිගණක හා මෝටර් රථ හැර සියලු දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම සඳහා සංස්ථාව පිරිවැය ආකෘතිය භාවිතා කරන අතර මිලදී ගැනීමේ පිරිවැය ගිණුම්ගත කරන්නේ ඒ සමග සිදුවන සියලු අමතර වියදම් වලින් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අඩුකල පසු අගයවේ.

#### ප්‍රත්‍යාගණන ආකෘතිය

ප්‍රත්‍යාගණන දිනට සාධාරණ මිලෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩුකල පසු වටිනාකමට අගය කර ඇති රථවාහන සංස්ථාව විසින් ප්‍රත්‍යාගණනය කර දක්වා ඇත. වාර්තා කරන දිනට සාධාරණ වටිනාකම භාවිතා කර තීරණය කර ඇති අගයට වඩා ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කාල පරිච්ඡේදයකට වරක් ප්‍රත්‍යාග ණනයන් සිදුකරයි. පෙර වසරවල, රථවාහන පිරිවැය ආකෘතිය යටතේ දක්වා ඇති අතර 2022 වසරේ පිරිවැය ආකෘතිය, ප්‍රත්‍යාගණන ආකෘතිය ලෙස වෙනස් කිරීම (LKAS 8) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම් සහ වැරදි නිවැරදි කිරීම්" පරිච්ඡේද 17 හි දක්වා ඇති නිදහස් කිරීම් අනුව අතීතානුයෝගී ලෙස "retrospective restatement" ගලපා දැක්වීමට අවශ්‍ය නොවීය.

මෝටර් රථ නැවත තක්සේරු කිරීමේදී, පෙර වසර වලදී ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනාගත් එම වත්කම් වල වටිනාකමෙහි අඩුවීමට හිලව් කිරීමක් සිදුනොකරන්නේ නම්, ප්‍රත්‍යාගණන අතිරික්තය ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරයි. පෙර හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන සංචිතය ඉක්මවන වටිනාකම අඩුවීම ලාභාලාභ ප්‍රකාශයේ අගය අඩුවීමක් ලෙස හඳුනා ගනියි. වත්කම් ඉවත් කිරීමේදී, ඉවත් කිරීමට අදාල ප්‍රත්‍යාග ණන සංචිතය, ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලබන අතර වත්කම් ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගනී.

උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් හා පරිගණක සාධාරණ වටිනාකමට ගණනය කර දක්වයි. උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් හා පරිගණක විශ්‍රාමික රජයේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවෙකු වන ජේ.එම්. සේනානායක බණ්ඩාර මහතා විසින් 2015.12.31 දිනට ප්‍රත්‍යාගණනය කළඅතර 2022 වසරේ ප්‍රත්‍යාගණනය කිරීම 2023.02.28 දින වන විට අවසන්වී නොතිබූ බැවින් එහි බලපෑම ඇතුලත් කර නොමැත.

### 3.4.3. ක්ෂය කිරීම

යන්ත්‍ර පිරියත හා උපකරණ අයිතමයන්ගේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය තුල සරල මාර්ග ක්‍රමයට වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව පිළිබිඹු වන පරිදි ලාභා ලාභ ගිණුමේ දී ක්ෂය හඳුනා ගනියි.

දේපළ, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 - 40 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 8 |
| රථ වාහන | වසර 10 |
| බයිසිකල් | වසර 6 සිට 7 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 10 |
| පරිගණක | වසර 4 |
| උපකරණ | වසර 5 |

වත්කම ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතා කිරීම ආරම්භ කල දින සිට වන අතර වත්කම විකිණීමට ඇති වත්කමක් ලෙස නම් කල දින හෝ ඉවත් කල දින අතරින් ප්‍රථමයෙන් පැමිණෙන දින සිට නවතා දමයි. වත්කමක සුන්බුන් අගය හා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර යෝග්‍ය නම් වසර අවසානයේ දී LKAS 8 ට අනුව ගැලපීම් සිදුකරයි.

### 3.4.4. හඳුනා නොගැනීම

යන්ත්‍ර පිරියත හා උපකරණ වල අයිතමයක් හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ අදාල වත්කමෙන් බලපොරොත්තු වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැතිවූ විට හෝ ඉවත්වූ විට හෝ වත්කම ඉවත් කල විට වේ. වත්කම ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය, යන්ත්‍ර පිරියත හා උපකරණ විකුණුම් මිල හා පොත් අගය සංසන්දනය කර ගණනය කරන අතර ලාභ හෝ අලාභ වෙනත් ආදායම් යටතේ දක්වයි.

### 3.4.5. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

රජයේ නියෝග දැඩිව පිළිපදිමින් හා සහාය දක්වමින් විකල්ප ක්‍රමවේද හරහා සංස්ථාව සිය මෙහෙයුම් දිගටම ක්‍රියාත්මක කරයි. දේපල, පිරියත හා උපකරණ ඌන උපයෝජනයක් සිදුවී නොමැත. රටේ පවතින මූල්‍ය අර්බුධකාරී තත්ත්වය ආශ්‍රිත අවධානම අවම කරගන්නා අතරම මෙහෙයුම් කටයුතු දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් හා ව්‍යාපාරික සැලසුම් ඇති බව කළමනාකාරිත්වය විශ්වාස කරන අතර වාර්තා කරන දිනට දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමේ අඩුවීමක් (impairment) අවශ්‍ය නොවන බව නිගමනය කරන ලදී.

### 3.5 නොනිම් වැඩ - ප්‍රාග්ධනය

ප්‍රවර්ථන වර්ෂයේ දී දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දී ප්‍රාග්ධනිත නොකල ප්‍රාග්ධන වියදම් නොනිම් වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේ දී ප්‍රාග්ධනිත ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

### 3.6. අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වශයෙන් සළකනු ලබන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙනයන අගය තීරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කරමිනි. ප්‍රාග්ධන සංවර්ධන වියදම් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල දරා ඇති වියදම දක්වනු ලැබේ.

සංස්ථාවේ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ඒවායේ තක්සේරු කල ඵලදායී ජීවිත කාලය තුල සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය කරයි.

### 3.7 කල්බදු

කල්බදු වත්කම් සංස්ථාවේ භාවිතයට පැවති දින සිට කල්බදු භාවිත අයිතිය සහිත වත්කම් හා ඒවාට අනුරූප වගකීම් ලෙස හඳුනා ගනියි. සංස්ථාවට ඔසුසල ගොඩනැගිලි, ගබඩා පහසුකම් හා සමහර තොරතුරු තාක්ෂණ උපකරණ සඳහා කල්බදු පවතී. කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකම් සහිත කල්බදු හැර සෑම කල්බද්දක්ම ශේෂපත්‍රයේ භාවිත අයිතිය සහිත වත්කම් හා කල්බදු වගකීම් ලෙස දක්වා ඇත.

#### (අ) භාවිත අයිතිය සහිත වත්කම්

පහත දත්ත පදනම් කරගත් පිරිවැය මත භාවිත අයිතිය සහිත වත්කම් ආරම්භයේදී ගණනය කරයි.

- කල්බදු වගකීම් වල මූලික ඇගයීමේ වටිනාකම
- ආරම්භක දිනයේ දී හෝ ඊට පෙර කරන ලද බදු ගෙවීම් වලින් ලැබී ඇති බදු දිරි දීමනා අඩුකල පසු වටිනාකම
- කවර හෝ ආරම්භක පිරිවැයක්, හා
- ඉවත්කිරීම් හෝ ප්‍රතිෂ්ඨාපන පිරිවැයක්.

භාවිත අයිතිය සහිත වත්කම් වල පසු අගය ගණනය කරනු ලබන්නේ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අගය අඩුවීම් ඇත්නම් අඩුකල පසුවේ. භාවිත අයිතිය සහිත වත්කම් වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය හා බදු කාල සීමාව අතරින් වඩා කෙටි කාලය තුල සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

#### (ආ) කල්බදු වගකීම්

SLFRS 16 ප්‍රමිතියේ විධිවිධානයන්ට අනුව, කල්බදු වගකීම් හඳුනා ගෙන වටිනාකම ගණනය කරනු ලබන්නේ, බදුකරුගේ වර්ධක ණය අනුපාතයට ඉතිරි කල්බදු ගෙවීම් වට්ටම් කිරීමෙනි. එය සමාන නියමයන්, කොන්දේසි හා සමාන ආරක්ෂක ඇපයක් සහිත සමාන ආර්ථික පරිසරයක් තුල භාවිතා අයිතිය සහිත වත්කමට සමාන වත්කමක් ලබාගැනීමට අරමුදල් ලබා ගැනීමේ දී ණය ගෙවීමට බදුකරු විසින් දැරිය යුතු පොලී අනුපාතයවේ.

සංස්ථාව කල්බදු වගකීම ශේෂපත්‍රයේ වෙනමම අයිතමයක් ලෙස දක්වන අතර කල්බදු වගකීම මත වූ පොලී වියදම මූල්‍ය වියදම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලබයි.

**(ඇ) කල්බදු වගකීම් නැවත මැනීම**

දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳාපවතින විචල්‍ය කල්බදු ගෙවීම් වල අනාගත වැඩිවීම් වලට සංස්ථාව නිරාවරණය වන නමුත් එම වැඩිවීම් ක්‍රියාත්මක වනතුරු කල්බදු වගකීම් වලට ඇතුලත් කර නොගනී. දර්ශකයක් හෝ අනුපාතයක් මත සිදුවන කල්බදු ගෙවීම් සඳහා ගැලපීම් සිදුකරන විට කල්බදු වගකීම නැවත ගණනය කර භාවිත අයිතිය සහිත වත්කම් වලට එරෙහිව ගලපනු ලබයි.

**(ඈ) වගකීම් ලෙස හඳුනා නොගත් කල්බදු ගෙවීම්**

කෙටිකාලින කල්බදු (බදුකාලය මාස 12 ක් හෝ එයට අඩු) හා අඩු වටිනාකම් සහිත කල්බදු, කල්බදු වගකීම් ලෙස හඳුනා නොගැනීමට තීරණය කරනලදී. එවැනි කල්බදු වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම්, සරල මාර්ග ක්‍රමයට වියදමට ගලපනු ලබයි. මීට අමතරව, ඇතැම් විචල්‍ය කල්බදු ගෙවීම් කල්බදු වගකීම් ලෙස පිළිගැනීමට අවසර නොදෙන අතර ඒවා වියදම් ලෙස ගිණුම් ගත කරයි.

## 3.8. බදුකරණය

### 3.8.1 වර්තමාන බදුකරණය

වර්තමාන බදු වත්කම් හා බදු වගකීම් වනුයේ බදු බලධාරීන්ට ප්‍රවර්ථන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගෙන් අයකර ගතයුතු වන වටිනාකම් වේ. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂපත්‍ර දින වන විට බලාත්මකව පවතින ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධන වල විධිවිධාන වලට අනුකූලව හා පනතේ නියම කර ඇති අනුපාතයනට අනුව බදු ගෙවීමේ කාර්‍ය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගෙන බදු ප්‍රතිපාදනය කර ඇත. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම් ගත ලාභය පදනම් කරගෙනය.

### 3.8.2. විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති සෑම වර්ගයකම තාවකාලික වෙනස්කම්, විලම්බිත බදු වත්කම් හා බැරකම් ගණනය සඳහා සලකා බලා ඇත. මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම්, විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වූ ප්‍රතිපාදනය, ණයගැති අගය අඩුවීම හා මතභේදාත්මක තොග සඳහා වෙන්කිරීම් විලම්බිත බදු ගණනය සඳහා සලකා බලා ඇත. සංස්ථාවේ විලම්බිත වත්කම් හා බැරකම් ආදායම් බදු අනුපාතය අනුව ගණනය කර දක්වයි.

විලම්බිත බදු වත්කම් වල පොත් අගය සෑම වාර්තා කරන වර්ෂයක් අවසානයේම සමාලෝචනය කර බදු අයකල හැකි ලාභයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමානවත් මට්ටමට අඩුකර දක්වයි. වසංගතය හේතුවෙන් අපේක්ෂිත බදු වියදම් අඩු වීමට ප්‍රතිචාර ලෙස විලම්බිත බදු වත්කම් වල ගැලපීම් අවශ්‍ය නොවන බව කළමනාකාරීත්වය තීරණය කර ඇත.

### 3.8.3 අධිභාර බද්ද

2022 අප්‍රේල් 8 වන දින නිකුත් කරන ලද 2022 අංක 14 දරන අධිභාර බදු පනතට අනුව, 2020/21 තක්සේරු වර්ෂයට අදාළ බදු ගෙවිය යුතු ආදායම වන රුපියල් මිලියන 2771.3 ක වටිනාකම වෙනුවෙන් සංස්ථාවට රු. මිලියන 692.8 ක බදු වගකීමක් ඇති විය. එකී පනතට අනුව, අධිභාර බද්ද 2020 ජනවාරි 1 වැනි දින ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස සැලකිය යුතුවේ. පනත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා අභිබවා යන බැවින්, 2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අධිභාර බදු සඳහා ගිණුම්කරණය පිළිබඳ SoAT මඟින් නිර්දේශිත පරිදි අධිභාර බදු වියදම ගිණුම් ගතකර ඇත.

## 3.9. භාණ්ඩ තොග

සංස්ථාවේ භාණ්ඩ තොග වටිනාකම් ගණනය කරනු ලබන්නේ කල් ඉකුත්වූ හා විකිණිය නොහැකි භාණ්ඩ සඳහා නිසි වෙන්කිරීම් කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මතවේ. ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු පදනමට අනුව තොග තක්සේරු කරයි. (FIFO)

ප්‍රධාන ගබඩාවේ සිට ඔසුසල වලට මාරු කරන සාමාන්‍ය හුවමාරු ආන්තිකය අනුව ගණනය කල තොග හුවමාරු ආන්තිකය ඉවත් කර ඔසුසල වල අවසාන තොග වටිනාකම ගණනය කරයි.

වෙළඳපල මිල ගණන් සලකා බලමින් සංස්ථාවේ මිල කමිටුව විසින් ඖෂධ මිල සූත්‍රය පදනම් කරගෙන මිල තීරණය කරයි.

### 3.9.1. තොග අගය කිරීම

**තොග පිරිවැය - ජිවනී ඒකකය**

**අමුද්‍රව්‍ය තොගය - ජිවනී ඒකකය**

අමතර වියදම්ද ඇතුලත්ව මිලදී ගැනීමේ පිරිවැයට

**නොනිම් වැඩ**

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

**නිමි භාණ්ඩ**

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

## 3.10. මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොලහක් හෝ අඩු කාලයක් තුල කල්පිරෙන ද්‍රවශීල තාවයෙන් ඉහල ආයෝජනයි. බැංකු අයිරාව ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

## 3.11. පර්යේෂණ වියදම්

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදුකරන පර්යේෂණ කටයුතු සඳහා වූ වියදම් එම වියදම් ඇතිවූ අවස්ථාවේදීම ලාභයට ගලපනු ලබයි.

## 4. බැරකම් හා ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදීය. ශේෂපත්‍රයේ පෙන්නුම් කරන මෙම වගකීම ශේෂපත්‍ර දිනයේදී ප්‍රක්ෂිප්ත ඒකක බැර ක්‍රමයට අනුව (Projected Unit Credit Method) තක්සේරු කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා බාහිර අරමුදලක් ඇතිකර නොමැත.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාලව තක්සේරු වන සියලු ආයුගණක ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වහාම ගිණුම්ගත කිරීමට සංස්ථාව කටයුතු කරයි.

වෘත්තීය ආයුගණක තක්සේරුකාර සමාගමක් වන Actuarial and Management Consultants (Pvt) Ltd ආයතනයේ එම්. පූපාලනාදන් මහතා විසින් 2022 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුව සිදු කරන ලදී. විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ගණනය කිරීමේදී පදනම් කරගත් උපකල්පන හා දත්ත මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 26 යටතේ දක්වා ඇත.

### 4.1.2. නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සේවකයන් වෙනුවෙන් ලබාදෙන දායකත්වයන් අදාල අරමුදල් රෙගුලාසි වලට අනුකූලව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකර අරමුදලට සැපයෙන දායකත්වයන් ආදායම් ප්‍රකාශය තුල වියදමක් වශයෙන් හඳුනා ගනු ලැබේ.

#### සේවක අර්ථසාධක අරමුදල

පිළිවෙලින් සංස්ථාව හා සේවකයන් ගමන් වියදම් දීමනා හැර දළ වැටුපෙන් 12% ක් හා 10% ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයයි.

සේවක භාරකාර අරමුදල

සංස්ථාව ගමන් වියදම් දීමනා හැර දළ සේවක වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී කාර්යානුගත වියදම් ක්‍රමය යොදාගෙන ඇත්තේ එමඟින් සංස්ථාවේ කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණව නිරූපනය වන බැවිනි.

### 5.1. ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 15 - ගනුදෙනු කරුවන් සමඟ ගිවිසුම් ගත ආදායම් ප්‍රමිතයේ පියවර පහ ප්‍රවේශයට අනුව සංස්ථාව ආදායම් හඳුනා ගැනීම හා නිර්ණය කිරීම සිදුකරයි. තෙවන පාර්ශවයන් වෙනුවෙන් රැස්කළ වටිනාකම් හැර ගනුදෙනුකරු සමඟ ගිවිසුමේ නිරූපිත ප්‍රතිෂ්ඨාව පදනම් කරගෙන සංස්ථාව සිය ආදායම නිර්ණය කරයි. සංස්ථාව ආදායම් හඳුනා ගන්නේ කාර්යසාධන බැඳීම් පිළිබඳ සෑහීමට පත්වන්නේ නම් පමණි.

සංසන්දනාත්මක කාලපරිච්ඡේදයේදී, ආර්ථික ප්‍රතිලාභය සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව නිශ්චිත ආදායම් හා ඊට සම්බන්ධ පිරිවැය නිවැරදිව ගණනය කළහැකි ආදායම් ගෙවීම් කර ඇති නැති බව නොසලකා උපචිත පදනමට හඳුනා ගන්නා ලදී. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබියයුතු ප්‍රතිෂ්ඨාවේ සධාරණ වටිනාකමට ආදායම ලෙස ගණනය කරනු ලබයි.

### 5.1.1 භාණ්ඩ හා සේවාවල ස්වභාවය

සංස්ථාව තම ආදායම් ජනනය කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් වලට අදාල ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්ති පහතින් දැක්වේ.

**i. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය හා වෙළඳාම මගින් ලද ආදායම්**

සංස්ථාව පහත ප්‍රභවයන් ගෙන් ආදායම් හඳුනා ගනියි;

| ගනුදෙනුකරු | ස්වභාවය, කාර්යසාධන බැඳීම පිළිබඳ තෘප්තිමත් බවට කාලය හා වැදගත් වන ගෙවීම් කොන්දේසි |
|---|---|
| බෙදාහරින්නන් / ඔළොත් වෙළඳුන් | සංස්ථාව ආදායම හඳුනාගන්නේ මාසිකව, ගනුදෙනුකරු භාණ්ඩ තම භාරයට ලබාගත් මොහොතේ දීය. සංස්ථාව විසින් මිල තීරණය කර බෙදාහරින්නන් වෙත අලෙවිකරන අතර මිලගණන් විටින් විට බෙදාහරින්නන් වෙත දැනුම් දෙනු ලබයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් බෙදාහරින්නන්ට නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් බෙදාහරින්නන්ට අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.<br><br>ගනුදෙනු කරුවන් විසින් මුලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට සමාන අවලංගු කල නොහැකි කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබාදිය යුතුවේ. බැංකු ඇපකරය ගිවිසුම් කාලය ආරම්භයේ සිට ගිවිසුම් කාලය පුරා බලාත්මකව තිබිය යුතුවේ. |
| රජයේ හමුදාවන්/රජයේ රෝහල්/පුද්ගලික රෝහල් | සංස්ථාව ආදායම හඳුනා ගන්නේ මාසිකව, ගනුදෙනු කරුවන්ට භාණ්ඩ භාරදුන් අවස්ථාවේදී වේ.<br><br>සංස්ථාව විසින් තීරණය කර ගනුදෙනු කරුවන්ට විටින්විට දැනුම් දෙනු ලබන මිලකට පාරිභෝගිකයින් වෙත භාණ්ඩ අලෙවිකරයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි. |

### ii. වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම සැපයීමෙන් ලද ආදායම්

වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලබාදුන් අවස්ථාවේදී ආදායම හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

### iii. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම නිෂ්පාදනය

ඖෂධ සංස්ථාව පහත ඖෂධ වර්ග නිෂ්පාදනය කර අලෙවි කරයි,

- ජීවනී
- ග්ලුකෝස්
- බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම්

**අවශ්‍යතා මත සමහර අයිතම සංස්ථාව විසින් නැවත ඇසුරුම් කරයි.**

භාණ්ඩ ගනුදෙනු කරුවන්ට භාරදුන් අවස්ථාවේදී නිෂ්පාදිත භාණ්ඩ විකුණුම් ලෙස හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

ආදායම හඳුනා ගැනීමේදී සංස්ථාව පහත විශේෂිත නිර්ණායකයන් ද සලකා බලයි.

### 5.1.2 ආපසු එවීමේ හිමිකම සහිත විකුණුම්

සංස්ථාව විසින් ආපසු එවීමේ හිමිකම සහිතව භාණ්ඩයේ පාලනය ගනුදෙනුකරුට ලබා දෙනුයේ,

* විකුණනු ලබන භාණ්ඩය කල් ඉකුත් වීමට ආසන්න වී ඇති විට
* නිකුත් කරනු ලබන අවස්ථාවේ භාණ්ඩය නරක්වී හෝ අව පැහැගැන්වී තිබූ විට
* අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත්වූ විට.

**ආපසු එවීමේ හිමිකම සහිතව විකුණූ භාණ්ඩ සංස්ථාව විසින් පහත පරිදි හඳුනා ගනියි.**

* සංස්ථාව හිමිකම් ලැබීමට අපේක්ෂා කළ වටිනාකමට මාරුකළ අයිතමයේ ආදායම ආපසු ගෙවීමේ වගකීම හා
* වත්කමක් (එයට අනුරූප විකුණුම් පිරිවැය ගැලපීම) සඳහා මුදල් ආපසු ගෙවීමේ වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගේ භාණ්ඩ ආපසු ලබා ගැනීම

එක් එක් වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේදී, මාරු කරන ලද භාණ්ඩ සඳහා හුවමාරු වශයෙන් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදල් තක්සේරු කිරීම සංස්ථාව විසින් යාවත් කාලීන කළ යුතු අතර අවශ්‍ය වූ විට ගනුදෙනු මිලට අනුරූප වෙනසක් සිදුකරයි.

මුදල් ආපසු ගෙවීමේ ප්‍රමාණයන් පිළිබඳ අපේක්ෂා වෙනස් වීම් සඳහා සංස්ථාව එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් ආපසු ගෙවීමේ වගකීම යාවත්කාලීන කල යුතුය. අනුරූප ගැලපීම සංස්ථාවේ ආදායම (හෝ ආදායමේ අඩුවීමක්) ලෙස හඳුනා ගනියි.

මුදල් ආපසු ගෙවීමෙන් වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගෙන් භාණ්ඩ ලබාගැනීමට සංස්ථාව හඳුනාගෙන ඇති වත්කමක් මුලින් ගණනය කරනු ලබන්නේ එම භාණ්ඩයේ ශුද්ධ අගයෙන් භාණ්ඩය ආපසු ගැනීම සඳහා අපේක්ෂිත පිරිවැයක් ඇත්නම් අඩු කිරීමෙනි. එක් එක් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ දී, ආපසු ලැබිය හැකි භාණ්ඩ පිළිබඳ අපේක්ෂාවන් හි වෙනස්වීම් හේතුවෙන් පැනනඟින වත්කම් ඇගයීම සංස්ථාව යාවත් කාලීන කළ යුතුය.

### 5.2 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනා ගනියි.

### 5.3 සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි

ඩෙමරේජ් ගාස්තු, හිඟ සැපයුම්, තොග හානි සහ ප්‍රමාද සැපයුම් මත අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මූල්‍ය ප්‍රකාශයන්හි සැලකිල්ලට ගෙන නොමැත. නමුත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකශන වල ඇතුලත් කර ඇත. 2022 වසර අවසානයේ දී ලැබියයුතු වන්දි වටිනාකම රු. මිලියන 2761 ක් විය. (2018.01.01 සිට 2022.12.31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව)

### 5.4. වියදම්

ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇතිවූ සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායමෙන් අඩුකර ඇත. අලුත්වැඩියාවන් හා අලුත්කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභයට ගලපයි.

### 5.4.1. මූල්‍ය වියදම්

ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත්කර ගැනීම, ගොඩනැගීම, නිෂ්පාදනය වෙනුවෙන් කෙලින්ම අදාලවන ණය පිරිවැය, අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කරයි. අනෙක් සියලුම ණය පිරිවැයන් පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකනු ලබයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරාපොලී, ණයවර ලිපි විවෘත්ත කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුලත් වේ.

### 5.4.2. පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රජයේ බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කර ගොඩනගාගත් ප්‍රතිශතයන් අනුව පොදුකාර්ය පිරිවැය බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

| | ර.බෙ.ග. | රා.ඖ.ස. |
|---|---|---|
| (අ) සේවක වේතන | 56% | 44% |
| (ආ) ගමන් වියදම් | 10% | 90% |
| (ඇ) සැපයුම් හා අවශ්‍යතා | 25% | 75% |
| (ඈ) අලුත්වැඩියා හා නඩත්තු | 50% | 50% |
| (ඉ) ප්‍රවාහන, සන්නිවේදන, | | |
| - උපයෝගීතා හා වෙනත් සේවා | 50% | 50% |
| (ඊ) පර්යේෂණ වියදම් | 65% | 35% |
| (උ) බැංකු අයිරා පොලී | (සත්‍ය වියදම) | (සත්‍ය වියදම) |

## 6 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම සහ පසු අගය කිරීම

### 6.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගනු ලබන්නේ අස්ථිත්වය සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදන වලට පාර්ශව කරුවෙකු වූ අවස්ථාවේදිය. සාමාන්‍ය පරිදි මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීම හඳුනා ගන්නේ හුවමාරු දිනයේ දී එනම් සංස්ථාව වත්කම විකිණීමට හෝ මිලදී ගැනීමට බැඳී සිටින දිනකදීය.

මූලික හඳුනා ගැනීමේදී, සංස්ථාව මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එහි සාධාරණ වටිනාකමට ගණනය කර ගලපයි මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නොවන විට, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත්කර ගැනීම හෝ නිකුත් කිරීම වෙනුවෙන් වැඩිවූ හා සෘජුවම අදාලවන ගනුදෙනු පිරිවැයට හඳුනා ගනියි.

### 6.1.1 මූල්‍ය වත්කම්

#### 6.1.1.1 වර්ගීකරණය හා පසු තක්සේරුව

සංස්ථාව පහත මිනුම් කාණ්ඩ යටතේ මූල්‍ය වත්කම් වර්ග කර ඇත.

* ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVPL)
* වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVOCI) හෝ :
* ක්‍රමක්ෂය පිරිවැය

ණය හා ප්‍රාග්ධන උපකරණ වර්ගීකරණයේ අවශ්‍යතා පහතින් විස්තර කර ඇතඃ

■ **ණය මෙවලම්**

ණය මෙවලම් යනු නිකුත් කරනු ලබන්නාගේ දෘෂ්ඨිකෝණයෙන් බලනවිට මූල්‍ය වගකීමක් ලෙස නිර්වචනය කල හැකි මෙවලම් වේ. ණය මෙවලම් වල වර්ගීකරණය හා පසු තක්සේරුව පහත කරුණු මත රඳා පවතී :

අ. වත්කම කළමනාකරණය සඳහා වන සංස්ථාවේ ව්‍යපාරික ආකෘතිය හා :

ආ. වත්කමේ මුදල් ප්‍රවාහයේ ලක්ෂණ

මෙම කරුණු පදනම්ව, සංස්ථාව තම ණය මෙවලම් පහත සඳහන් මිණුම් කාණ්ඩ තුනට වර්ගීකරණය කර දක්වයි.

#### 6.1.1.1.1 ක්‍රමක්ෂේපිත පිරිවැය

ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීම සඳහා තබාගන්නා මුදල් ගලාවීම මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන (SPPI) හා ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVPL) දැක්වීමට නියම කර නොමැති, වත්කම් ක්‍රමක්ෂේපිත පිරිවැයට දක්වනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලද පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වයි. අතැති මුදල් හා බැංකු මුදල් සේවක ණය, වෙළඳ ණයගැතියෝ හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සංස්ථාව මෙම වර්ගීකරණය යටතේ දක්වයි.

#### 6.1.1.1.2 විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVOCI)

මුදල් ගලා ඒමේදී මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL) දැක්වීමට නියම කර නොමැති, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීමට හෝ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට නිර්ණය කර දක්වයි. (FVOCI) මූල්‍ය වත්කම් හානිකරන ලාභ හෝ අලාභ හඳුනා ගැනීම් ද, මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ෂේපිත පිරිවැය මත පොලී ආදායම හා ලාභාලාභ ගිණුමෙහි හඳුනාගත් විදේශ මුදල් හුවමාරු ලාභ හෝ අලාභ ද හැර ධාරණ අගයෙහි විචලනයන් විස්තීරණ ආදායම් ගිණුමෙහි ගලපයි. මූල්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් බැහැර කරන විට, කළින් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා හඳුනා ගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධය වෙනස්වීමේ සිට ලාභ හෝ අලාභ ලෙස වර්ග කර ලාභාලාභ ගිණුමට ගලපයි. මෙම මූල්‍ය වත්කම් වල පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස දක්වනු ලබයි. මෙම වර්ග කිරීම යටතේ ගැනෙන කිසිදු මූල්‍ය වත්කමක් දැනට සංස්ථාව සතුව නොමැත.

#### 6.1.1.1.3 ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල

ක්‍රමක්ෂේපිත පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ මිලට (FVOCI) යන නිර්ණායක වලට නොගැනෙන වත්කම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල ක්‍රමයට අගය කරයි. හෙයින් ගිවිසුමක කොටසක් නොවන ණය ආයෝජනයක් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට පසු ගණනය කල විට පැන නගින ලාභය හෝ අලාභය කාල සීමාවට අදාල ලාභාලාභ ගිණුමේ ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගනියි. එය සාධාරණ මිලට නම් කරන ලද හෝ විකිණීම සඳහා නොවන ණය උපකරණයකින් පැන නගින්නක් නොවන්නේනම් ලාභාලාභ ප්‍රකාශයේ වෙනමම ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට අනුව ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුලත් කරයි. දැනට සංස්ථාව සතුව මෙම කාණ්ඩය යටතට ගැනෙන කිසිදු වත්කමක් නොමැත.

* **ව්‍යාපාර ආකෘතිය**

මුදල් ප්‍රවාහය ජනනය කිරීම සඳහා සංස්ථාව වත්කම් කළමනාකරණය කරන ආකාරය ව්‍යාපාරික ආකෘතියෙන් පිළිබිඹු වේ. එනම් සංස්ථාවේ පරමාර්ථය තනිකරම වත්කම් වලින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය හා වත්කම විකිණීමෙන් පැනනගින ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය යන දෙකම සඳහා ද යන්නයි. එසේ නොවන විට ( උදා : විකිණීම අරමුණු කරගත් මූල්‍ය වත්කම්) එවිට මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියෙන් වෙනත් කොටසක් ලෙස වර්ගීකරණය කර ලභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට ගණනය කරනු ලබයි. වත්කම් සමූහයක් සඳහා ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමේ දී සංස්ථාව වත්කම සඳහා මුදල් ප්‍රවාහය එකතු කරන ආකාරය පිළිබඳ පෙර අත්දැකීම්, වත්කම් වල ක්‍රියාකාරිත්වය අගයන ආකාරය හා ප්‍රධාන කළමනාකරිත්ව නිලධාරීන්ට වාර්තා කරන ආකාරය, අවධානම් තක්සේරුකර කළමනාකරණය කරන්නේ කෙසේද, හා කළමනාකරුවන්ට හානිපූරණය කරන්නේ කෙසේද යන්න සලකා බලයි.

* **මුළු මුදල හා පොලිය පමණක් ගෙවීම** (SPPI)

ව්‍යාපාර ආකෘතිය විසින්, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබා ගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හා විකිණීම සඳහා වත්කම් තබාගන්නා අවස්ථාවල දී සංස්ථාව විසින් මූල්‍ය උපකරණයේ මුදල් ප්‍රවාහය මුළු මුදල හා පොලිය පමණක් නියෝජනය කරන බවට තක්සේරු කරයි. (SPPI Test) මෙම තක්සේරු කිරීමේදී, සංස්ථාව විසින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය මූලික ණය දීමේ විධිවිධාන වලට අනුකූලද යන්න සලකා බලයි. උදා. පොලියට ඇතුලත් වන්නේ මුදල් වල කාල වටිනාකම, ණය අවධානම, වෙනත් මූලික ණය දීමේ අවධානම් හා මූලික ණය විධිවිධානයන්ට අනුව ලාභ ආන්තිකය පමණද. මූලික ණය විධිවිධානයන්ට නොගැලපෙන අවධානම් හෝ අස්ථාවරත්වයට නිරාවරණය වීම් ගිවිසුම් කොන්දේසි මඟින් හඳුන්වා දෙන විට අදාල මූලික වත්කම ලාභාලාභ ගිණුම හරහා සධාරණ වටිනාකමට වර්ගීකරණය කර ගණනය කරණු ලබයි.

සංස්ථාව ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය වෙනස්වූ විට පමණි. නැවත වර්ගීකරණය සිදුවන්නේ වෙනස් වීමෙන් පසු පළමු වාර්තා කරන කාලපරිච්ඡේදයේ ආරම්භයේ සිටය. එවැනි වෙනස්කම් ඉතා කලාතුරකින් සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර සලකා බලන කාලය තුල එවැනි කිසිවක් සිදුවී නොමැත.

### 6.1.1.2 වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට හා (FVOCI) ක්‍රමයට ඉදිරියට ගෙන එන ලද සංස්ථාවේ ණය උපකරණ වත්කම් වල අපේක්ෂිත ණය අලාභ (ECL) අනුව ඉදිරියට ගෙනයන පදනම තක්සේරු කරයි. එක් එක් වාර්තා කරන දිනයේදී එවැනි පාඩු සඳහා වෙන්කිරීමක් සිදුකරයි. අපේක්ෂිත ණය අලාභ (ECL) ඇගයීම පහත කරුණු මත වේ.

* සිදුවිය හැකි ප්‍රතිඵල පරාසය තක්සේරු කළ අපක්ෂපාතී හා බරතැබූ සම්භාවිතා වටිනාකම

* මුදලේ කාල වටිනාකම හා

* අතීත සිදුවීම්, වර්තමාන තත්ත්වයන් හා අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ පුරෝකථන අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව වාර්තා කරන දිනයේදී ලබාගත හැකි සාධාරණ හා සහාය තොරතුරු.

පවතින ආර්ථික අර්බුධයේ බලපෑම හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ වෙළඳ ණය හානිකරණය සඳහා වෙන්කිරීම ගණනයේදී සලකා බලන, 2022 දෙසැම්බර් 31 දිනට පැහැර හැරීමේ සම්භාවිතාවය (Probability of Default), පැහැර හැරීමේ අලාභ (LGD) හා ආර්ථික සාධක ගැලපීම් (EFA) එම වෙන්කිරීම් වටිනාකම සැලකියයුතු ලෙස වැඩිකර දැක්වීමට හේතුවිය. සාධාරණ වෙන්කිරීමක් සිදුකිරීම සඳහා ආර්ථික සාධක ගැලපීමේ දී EFA හිඟ මුදල්වල සවභාවයන් සලකා බලන ලදී

ගිණුම් ප්‍රමිත SLFRS 09 වෙත අනුගත වීමේදී "Moore Stephan Aiyar" ආයතනය විසින් සපයනු ලබූ උපදේශන සේවා මත පදනම්ව වෙළඳ ලැබිය යුතු මුදල් අපහායනය ගණනය කර ඇත. ඒ අනුව, ණය පැහැර හැරීමේ සම්භාවිතාවයෙන් (PD) ව්‍යුත්පන්න වූ පාඩු අනුපාතිකය මත පදනම්ව, වෙළඳ ලැබිය යුතු ප්‍රතිපාදන මත සිදු වූ පාඩුව ගණනය කරනු ලබන අතර, ඒ අනුව, ආර්ථික සාධක ගැලපීම (EFA) මඟින් අපේක්ෂිත ණය අලාභය (ECL) ගණනය කරයි.

ණය ශේෂ දිගු කාලයක් පවතී නම් සහ එහි අයකර ගැනීම බෙහෙවින් සැක සහිත නම්, එම ශේෂ සඳහා සම්පූර්ණයෙන්ම වෙන්කිරීම් සිදුකරයි. එවැනි වෙන්කිරීම් සඳහා EFA ආර්ථික සාධක ගැලපීම නොකරයි.

හානිකරණය ගණනය කිරීම සුවිශේෂී හානිකරණය සහ සාමූහික හානිකරණය මත පදනම්ව පහත දක්වා ඇති කාණ්ඩ 3 යටතේ සිදු කර ඇත.

- ඇපවූ ණය ගැතියන්, රාජ්‍ය අංශයේ ණය ගැතියන් සහ පුද්ගලික අංශයේ ණයගැතියන්.
- නඩු පවරා ඇති ණයගැතියන්
- වෛද්‍ය සැපයුම් අංශය - (MSD)

පැහැර හැරීමේ සම්භාවිතාව (PD) ගණනය කරනු ලබන්නේ ලබා දී ඇති වර්ෂයක් සඳහා වන මුළු MSD විකුණුම් වලට MSD ණය ශේෂය අනුපාතයක් ලෙස සලකා වේ. මේ සඳහා ඓතිහාසික දත්ත (වාර්ෂික ශේෂය) භාවිතා කරයි. හිඟ ශේෂය මත පදනම්ව පාඩු අනුපාතය ව්‍යුත්පන්න වේ. හිඟ ශේෂය ලබා ගැනීමේදී, (Term loan) ලැබුණු කාලීන ණය (මූල්‍ය ප්‍රකාශනවල සටහන 27 අනුව) MSD ණය පියවීම සඳහා අපට ලැබී ඇති බැවින් එය ලැබීමක් ලෙස සලකයි.

### 6.1.1.2.1 අපේක්ෂිත ණය පාඩු දීමනාව (ECL) ගණනය කිරීම

ක්‍රමක්ෂය පිරිවැයට හා FVOCI ක්‍රමයට ගණනය කරන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනාව ගණනය කිරීම යනු සංකීර්ණ ආකෘතීන් භාවිතා කිරීම හා අනාගත ආර්ථික තත්ත්වයන් හා ණය හැසිරීම පිළිබඳ සැලකිය යුතු උපකල්පන අවශ්‍ය වන ක්ෂේත්‍රයකි. (උදා : ගනුදෙනු කරුවන් පැහැරහැරීම හා එහි ප්‍රතිඵල වශයෙන් ඇතිවන පාඩු ඇතිවිය හැකි බව) අපේක්ෂිත ණය පාඩු (ECL) ගණනය කිරීම සඳහා ගිණුම්කරණ අවශ්‍යතා ක්‍රියාවට නැංවීමේදී සැලකිය යුතු විනිශ්චයන් ගණනාවක් අවශ්‍යවේ.

* සැලකිය යුතු ලෙස ණය අවදානම වැඩි කරනු ලබන නිර්ණායක තීරණය කිරීම

* (ECL) ගණනය කිරීම සඳහා සුදුසු ආකෘතීන් හා උපකල්පන තෝරා ගැනීම

* සෑම වර්ගයකම භාණ්ඩ/වෙළඳපොල හා ඒ ආශ්‍රිත ECL වෙනුවෙන් වූ අවස්ථා අගයකිරීම හා සාපේක්ෂ බර තැබීම් ප්‍රතිෂ්ඨාපනය හා

* ECL ගණනය කිරීම සඳහා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩ පිහිටුවීම

ECL ගණනය කිරීම සඳහා සංස්ථාව විසින් ගන්නා ලද තීරණ හා ඇස්තමේන්තු කිරීම් පහත පරිදිවේ.

* අපේක්ෂිත ණය පාඩු යනු පැහැර හැරීමේ සම්භාවිතාව (PD) පැහැර හැරීම් මතවූ අලාභ (LGD) හා ආර්ථික සාධක ගැලපුම් (EFA) අඩුකල පසු අගයවේ. (PD) යනු ණයගැතියෙකු සිය මූල්‍ය වගකීම පැහැර හැරීමේ සම්භාවිතාවය, එනම් ඉදිරි මාස 12 තුල හෝ වගකීමේ ඉතිරි ජීවකාලය තුලවේ.

* පැහැර හැරීම් වලට අනාවරණය වීම තුලින් සංස්ථාව අපේක්ෂා කරන අලාභයේ ප්‍රමාණය LGD මඟින් නියෝජනය කරයි. LGD ගණනය කරනු ලබන්නේ ජීව කාලය පදනම් කරගෙන වන අතර ජීවකාලය තුල LGD යනු ණයෙහි ඉතිරි අපේක්ෂිත ජීව කාලය තුල පැහැර හැරීමක් සිදු වුවහොත් සිදුවීමට අපේක්ෂිත අලාභයේ ප්‍රතිශතය වේ.

* සංස්ථාව වසර එකොළහක ආර්ථික දත්ත පදනම් කර ගනිමින් වසර 5 ක් සඳහා ආර්ථික වර්ධනය පිළිබඳව පුරෝකථනය කර ඇති අතර සංස්ථාවේ වර්ධනයේ බලපෑම පිළිබඳ බර තැබූ සම්භාවිතාව භාවිතා කරමින් ආර්ථික සාධක ගැලපුම (EF) පිළියෙල කරයි. ප්‍රධාන ගනුදෙනු කරුවන්ගේ ස්වභාවය හේතුවෙන් සංස්ථාවේ වර්ධනයට බලපාන ප්‍රධාන සාධකය ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය EFA ගණනය සඳහා යොදා ගනියි.

### 6.1.1.3 හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූල්‍ය වත්කම් හෝ එයින් කොටසක්, හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලැබීමේ ගිවිසුම් කාලය අවසන් වූ විට, හෝ ඒවා මාරුකලවිට හෝ (1) සංස්ථාව තම හිමිකාරත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකියයුතු ලෙස මාරු කලවිට, හෝ (2) සංස්ථාව තම හිමිකාරත්වයේ හා වත්කමේ පාලනය කිරීමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරුකිරීම හෝ රඳවා ගැනීම නොකරන විට.

සංස්ථාව වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා ගිවිසුම් ගත අයිතිවාසිකම් රඳවා ගන්නා නමුත් එම මුදල් ප්‍රවාහයන් වෙනුවෙන් වූ ගිවිසුම් ගත බැඳීම් වෙනත් ආයතන භාර ගන්නා විට හා සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිවයුතු ලෙස මාරු කරන විට. මෙවැනි ගනුදෙනු “pass through” මාරු කිරීම් ලෙස සැලකෙන අතර ගණුදෙනු හඳුනා නොගැනෙන්නේ සංස්ථාව,

* වත්කම් වලින් සමාන මුදලක් එකතු කිරීම හැර ගෙවීම් කිරීමට බැඳීනැති විටදී.
* වත්කම විකිණීමට හෝ ඇපයට තැබීම තහනම්; හා
* වෙනත් වත්කමකින් එකතු කරන යම් මුදලක් ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ප්‍රේෂණය කිරීමට බැඳී ඇති විට.

### 6.1.2 මූල්‍ය වගකීම්

### 6.1.2.1 වර්ගීකරණය හා පසු අගය කිරීම

ප්‍රවර්තන වර්ෂයේ හා පෙර වර්ෂවල, ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිලට අගය කරන මූල්‍ය වගකීම් හැර අනෙක් මූල්‍ය වගකීම් වර්ගීකරණය හා පසු ඇගයීම ක්‍රමක්ෂය පිරිවැයට සිදුකර ඇත. මෙම වර්ගීකරණය ව්‍යුත්පන්න, විකිණීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා මූලික හඳුනා ගැනීමේදී නම් කරන ලද වෙනත් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

සාධාරණ මිලට ලාභාලාභ ගිණුම හරහා අගය කිරීමට නම් කරන ලද මූල්‍ය වගකීම් වලින් ජනනය වූ ලාභ හෝ අලාභ වලින් කොටසක් වෙනත් විස්තීරණ ආදායම් යටතේ දක්වයි. (වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම් වලට හේතු වන මූල්‍ය වගකීම් වල සාධාරණ වටිනාකමේ වෙනස, එය වෙළඳපොල අවදානමට තුඩු දෙන වෙළඳපොල තත්ත්වයන් හා වෙනස්වීම් වලට ආරෝපනය නොවන ප්‍රමාණය) ඉතිරි කොටස ලාභාලාභ ගිණුමේ දක්වයි. (වගකීම් වල සාධාරණ වටිනාකමෙහි ඉතිරි වෙනස) මෙවැනි ඉදිරිපත් කිරීමක් මඟින් ගිණුම්කරණ නොගැලපීම් ඇතිවීම හෝ විශාල වීමක් සිදුනොවේ නම්, වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම් නිසා ඇතිවන වාසි හා අවාසි ද ලාභය හෝ අලාභය ලෙස ඉදිරිපත් කරනු ලැබේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වටිනාකම් හා බැංකු අයිරාව ඇතුලත් වේ.

### 6.1.2.2 හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූල්‍ය වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලබන්නේ එම වගකීම් අවසන්වූ විටය. (උදා : ගිවිසුමෙහි සඳහන් කර ඇති කරුණු වලින් නිදහස්වූ විට, අවලංගුවූ විට හෝ අවසන්වූ විට වේ.)

## 6.2. ගණනය කිරීමේ ක්‍රම

### ක්‍රමක්ෂය පිරිවැය හා සඵල පොලී අනුපාතය

ක්‍රමක්ෂය පිරිවැය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් මූලිකව හඳුනා ගැනීමේදී ගණනය කර අඩු කරන මූලික ආපසු ගෙවීම් වටිනකමට, එකතු හෝ අඩු කල සඵල පොලී අනුපාතයට අනුව ගණනය කරන මූලික හඳුනා ගැනීමේ වටිනාකම හා කල්පිරීමේ වටිනාකම අතර වෙනසට මූල්‍ය වත්කම් වල අලාභ සඳහා වෙන්කිරීම් තිබේ නම් ගැලපූ අගයයි.

සඵල පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ඇස්තමේන්තුගත අනාගත කාලය සඳහා නිවැරදිව වට්ටම් කල මුදල් ගෙවීම් හෝ ලැබීම් සිට දළ වශයෙන් මූල්‍ය වත්කමක ඉදිරියට ගෙන ආ අගයෙහි අනුපාතයවේ. (එනම් කිසියම් හානිකරණ දීමනාවක් ඇත්නම් එය ගැලපීමට පෙර ක්‍රමක්ෂය පිරිවැය) හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 7 ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **ආදායම - රා.ඔ.ස.** | | |
| තොග වෙළඳාම | 1,931,939,808 | 2,952,076,633 |
| ජීවනී වෙළඳාම | 142,735,292 | 159,003,516 |
| ඔසුසල වෙළඳාම ( සටහන 30) | 7,834,498,737 | 6,270,536,152 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම් | (7,013,753) | (9,068,148) |
| ණය රක්ෂණ යෝජනා ක්‍රමය | 1,471,313 | 2,850,703 |
| සැපයුම් කරුවන්ගෙන් අයවූ වන්දි | 42,217,721 | 71,423,261 |
| **එකතුව** | **9,945,849,118** | **9,446,822,118** |
| **ආදායම - ර.බෙ.ග.** | | |
| ආනයනික සැපයුම් | 27,257,000,998 | 24,299,943,685 |
| දේශීය සැපයුම් | 12,827,156,588 | 29,156,290,884 |
| එන්නත් ආනයනය කිරීම | 141,465,149 | 13,887,481,786 |
| ම.මි.ගැ.ඒකකය හරහා සැපයුම් | 65,452,439 | 2,765,069,155 |
| අමතර ගබඩා ගාස්තු | 130,650,127 | 41,910,702 |
| සැපයුම් කරුවන්ගෙන් අයවූ වන්දි | 525,708,055 | 570,472,023 |
| ප්‍රමාදවී සැපයුම් මත දඩ | 25,684,133 | 132,086,976 |
| **එකතුව** | **40,973,117,489** | **70,853,255,211** |
| **මුළු ආදායම** | **50,918,966,607** | **80,300,077,329** |

### 7.1 ආපසු එවීමේ පදනම යටතේ විකුණුම්

විකුණුම් ආපසු එවීම්, සංස්ථාවේ සමස්ථ විකුණුම් හා සසඳන කළ ප්‍රමාණාත්මක නොවේ. කෙසේ වුවත්, විකුණුම් ආපසු හරවා එවීමේ සම්භාවිතාව හා එවැනි ප්‍රමාණාත්මක හරවා එවීම් පවතී නම් ගැලපීම සඳහා නිරීක්ෂණය කරයි.

## 8 විකුණුම් පිරිවැය/සෘජු වියදම් - ර.බෙ.ග

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **ආදායම** | **40,973,117,489** | **70,811,344,509** |
| **සෘජු වියදම්** | | |
| ර.බෙ.ග. ඇණවුම් වල පිරිවැය (මි.ර.ගැ.වටිනාකම) | 24,249,130,219 | 21,964,064,214 |
| බදු හා තීරුගාස්තු | 623,715,657 | 752,126,279 |
| දේශීය සැපයුම් පිරිවැය | 12,333,881,836 | 28,171,554,257 |
| ම.මි.ගැ.ඒකකය හරහා සැපයුම් - ර.බෙ.ග. | 62,935,038 | 2,658,720,341 |
| එන්නත් ආනයනය | - | 12,144,389,961 |
| **එකතුව** | **37,269,662,750** | **65,690,855,053** |
| **වෙනත් සෘජු වියදම්** | | |
| නිෂ්කාශන ගාස්තු( මුද්දර ගාස්තු, කොමිස්,ණයවර ලිපි ගාස්තු හා අනෙකුත්) | 672,352,293 | 987,060,371 |
| ගොඩබෑමේ වියදම් | 56,653,061 | 97,182,364 |
| ආනයන බලපත්‍ර ගාස්තු | 225,355,423 | 191,506,861 |
| **එකතුව** | **954,360,778** | **1,275,749,596** |
| **මුළු වටිනාකම** | **38,224,023,527** | **66,966,604,648** |
| **අඩුකලා: මාර්ගස්ථ තොග** | 40,000,547 | 697,376,583 |
| **සෘජු වියදම්/ විකුණුම් පිරිවැය** | 38,184,022,980 | 66,269,228,066 |
| **දළ ලාභය/අතිරික්තය** | **2,789,094,509** | **4,542,116,443** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 9 විකුණුම් පිරිවැය - රා.ඖ.ස.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | තොග වෙළඳාම රු. | ඔසුසල වෙළඳාම රු. | මුළු වෙළඳාම රා.ඖ.ස.- 2022 රු. | මුළු වෙළඳාම රා.ඖ.ස.- 2021 රු. |
|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ වෙළඳ තොගය | 1,023,792,986 | 1,288,609,296 | 2,312,402,281 | 2,712,932,063 |
| **එකතු කළා:** | | | | |
| ආනයනික බෙහෙත් | 2,705,749,515 | | 2,705,749,515 | 2,399,883,034 |
| රසායනාගාර අමුද්‍රව්‍ය | 179,555 | | 179,555 | 3,297,618 |
| ර.ඖ.ස. ටෙන්ඩර් සඳහා දේශීය මිලදී ගැනුම් | 1,120,740,016 | | 1,120,740,016 | 1,893,636,859 |
| ම.මි.ගැ. ඒකකයේ මිලදී ගැනුම් | 246,734,447 | | 246,734,447 | 247,218,409 |
| ඔසුසල සඳහා දේශීය මිලදී ගැනුම් ( සටහන 30. | - | 4,411,664,961 | 4,411,664,961 | 2,270,752,265 |
| තොග මාරු කිරීම් (සටහන 30.1) | (3,018,399,198) | 3,018,399,198 | - | - |
| **විකිණීම සඳහා තිබූ වෙළඳ තොගය** | **2,078,797,320** | **8,718,673,455** | **10,797,470,775** | **9,527,720,248** |
| අඩු කලා: වර්ෂය අවසානයේ වෙළඳ තොගය | 874,150,693 | 2,165,122,438 | 3,039,273,131 | 2,442,253,906 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **1,204,646,628** | **6,553,551,016** | **7,758,197,644** | **7,085,466,342** |

## 10 ග්ලූකෝස්, ජීවනී සහ බී.බී. ක්‍රීම් නිෂ්පාදන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය ආරම්භක තොගය | 854,087 | 1,148,181 |
| **එකතු කලා:** අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 45,063,530 | 55,319,722 |
| **අඩු කලා:** අමුද්‍රව්‍ය අවසන් තොගය | 1,814,570 | 854,087 |
| **භාවිතා කළ අමුද්‍රව්‍ය පිරිවැය** | **44,103,047** | **55,613,816** |
| **එකතු කලා:** නිෂ්පාදන පිරිවැය - (සටහන 10.1) | 74,430,841 | 80,145,514 |
| **තොගයේ නිෂ්පාදන පිරිවැය** | **118,533,888** | **135,759,330** |

**ජීවනී වෙළඳාම**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ආරම්භක තොගය (නිමි භාණ්ඩ) | - | 1,059,986 |
| **එකතු කලා:** තොගයේ නිෂ්පාදන පිරිවැය | 118,533,888 | 135,759,330 |
| **අඩු කලා:** අවසාන තොගය (නිමි භාණ්ඩ) | 466,831 | - |
| **විකුණුම් පිරිවැය** | **118,067,057** | **136,819,315** |
| විකුණුම් | 142,735,292 | 159,003,516 |
| අඩුකලා: විකුණුම් පිරිවැය | 118,067,057 | 136,819,315 |
| **දළ වෙළඳ ලාභය** | **24,668,235** | **22,184,201** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 10.1 නිෂ්පාදන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022<br>රු | 2021<br>රු |
|---|---|---|
| වැටුප්, වේතන හා දීමනා | 33,541,526 | 34,793,626 |
| අතිකාල දීමනා | 1,947,238 | 3,686,724 |
| නිල ඇඳුම් | 238,730 | 20,400 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 1,032,110 | 551,461 |
| අර්ථසාධක (EPF & ETF) | 4,018,216 | 4,115,649 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 600,000 | 432,000 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 640,200 | 797,250 |
| වාර්ෂික කාර්ය සාධන ප්‍රසාද දීමනා | 1,857,267 | 2,293,866 |
| සේවක සුභසාධන වියදම් | 1,122,214 | 1,409,532 |
| වෛද්‍ය වියදම් | 463,697 | 459,359 |
| විදුලිය | 2,905,316 | 4,184,953 |
| ක්ෂය කිරීම | 9,349,596 | 10,763,486 |
| අලුත්වැඩියා හා නඩත්තු | 3,893,673 | 3,988,416 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 12,821,059 | 12,648,792 |
| **එකතුව** | **74,430,841** | **80,145,514** |

## 11 අනෙකුත් මෙහෙයුම් ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022<br>රු | 2021<br>රු |
|---|---|---|
| **රා.ඖ.ස** | | |
| ටෙන්ඩර් හා ආකෘති පත්‍ර විකුණුම් | 22,590,813 | 68,321,136 |
| ගෙවල් කුලී ලැබීම් | 704,339 | 53,336 |
| භාණ්ඩාගාර බිල්පත් පොලී | 13,166,696 | 4,787,139 |
| අබලි ද්‍රව්‍ය විකුණුම් | 125,645 | 54,385 |
| අරමුදල් කළමනාකරන ආදායම් | 35,369,962 | 4,438,930 |
| විවිධ ආදායම් | 27,541,591 | 4,193,070 |
| නිවාඩු නිකේතනයන් ගෙන් ලද ආදායම් | - | 149,425 |
| පෙර සුදුසුකම් ලබාදීමේ ගාස්තු | 2,251,750 | - |
| තොග අතිරික්තය | 397,021 | - |
| සාම්පල් පරීක්ෂාකිරීමේ ආදායම් | 2,366,194 | 2,149,560 |
| "Prescriber" සඟරාව | 6,700 | 12,125 |
| නිෂ්කාශනය නොවූ හා ප්‍රමාදවූ චෙක්පත් මත දඩ | 954,460 | 2,517,801 |
| වත්කම් ඉවත් කිරීම් මත ලාභ | 1,634,771 | 1,854,296 |
| **එකතුව** | **107,109,942** | **88,531,203** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 12 පරිපාලන වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඕ.ස. වෙළඳ කටයුතු | | | මුළු වෙළඳාම | මුළු වෙළඳාම | මුළු වෙළඳාම | මුළු වෙළඳාම |
|---|---|---|---|---|---|---|---|
| | ඔසුසල | ජීවනී ඒකකය | තොග වෙළඳාම | රා.ඕ.ස. | ර.බෙ.ග. | 2022 | 2021 |
| **සේවක වේතන** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වැටුප්, වේතන හා දීමනා | 486,239,102 | - | 276,882,597 | 763,121,699 | 352,396,033 | 1,115,517,732 | 1,094,916,891 |
| අතිකාල දීමනා | 33,210,461 | - | 6,599,847 | 39,810,308 | 4,399,898 | 44,210,206 | 47,567,783 |
| සේවක පුහුණු වියදම් | - | - | 967,042 | 967,042 | 1,230,780 | 2,197,822 | 565,500 |
| නිල ඇඳුම් | 4,160,319 | - | 1,171,908 | 5,332,227 | 1,491,519 | 6,823,746 | 4,864,180 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 5,195,662 | - | 4,649,427 | 9,845,089 | 5,917,453 | 15,762,542 | 19,052,026 |
| අර්ථසාධක | 55,550,437 | - | 32,205,754 | 87,756,191 | 40,989,142 | 128,745,333 | 129,628,252 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 7,530,000 | - | 4,270,438 | 11,800,438 | 5,435,103 | 17,235,541 | 12,223,070 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 9,670,800 | - | 4,066,163 | 13,736,963 | 5,175,116 | 18,912,079 | 22,256,350 |
| ක්‍රීඩා සමාජ | - | - | 651,801 | 651,801 | 829,565 | 1,481,367 | 807,457 |
| වාර්ෂික කාර්ය සාධන ප්‍රසාද දීමනා | 29,172,436 | - | 17,635,650 | 46,808,086 | 22,445,373 | 69,253,459 | 69,970,743 |
| සේවක පාරිතෝෂිකය ( සටහන 26.3) | - | - | 42,060,798 | 42,060,798 | 53,531,925 | 95,592,723 | 73,805,510 |
| ඉඩම්/නිවාස ණය පොලී | 3,599,697 | 76,886 | 2,158,663 | 5,835,246 | 2,747,389 | 8,582,635 | 9,058,782 |
| රා.ඕ.නි.ස. සංවත්සර ගෙවීම් | - | - | 1,658,362 | 1,658,362 | 2,110,643 | 3,769,005 | 1,519,400 |
| **එකතුව** | **634,328,914** | **76,886** | **394,978,451** | **1,029,384,251** | **498,699,939** | **1,528,084,190** | **1,486,235,945** |
| **ගමන් වියදම්** | | | | | | | |
| දේශීය ගමන් වියදම් | 919,895 | 10,270 | 2,698,445 | 3,628,609 | 299,827 | 3,928,436 | 7,198,038 |
| **එකතුව** | **919,895** | **10,270** | **2,698,445** | **3,628,609** | **299,827** | **3,928,436** | **7,198,038** |
| **සැපයුම් හා අවශ්‍යතා** | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 10,927,119 | 382,260 | 25,717,218 | 37,026,597 | 8,572,406 | 45,599,003 | 24,744,850 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම් | - | - | 31,620 | 31,620 | 10,540 | 42,160 | 27,055 |
| වෙනත් සංග්‍රහ වියදම් | - | - | 267,579 | 267,579 | 89,193 | 356,772 | 265,955 |
| රථවාහන අළුත්වැඩියා වියදම් | - | - | 9,177,820 | 9,177,820 | 3,059,273 | 12,237,093 | 11,787,271 |
| ඉන්ධන වියදම් | - | - | 13,066,277 | 13,066,277 | 4,355,426 | 17,421,703 | 14,403,748 |
| වාහන බලපත්‍ර ගාස්තු | - | - | 145,841 | 145,841 | 48,614 | 194,454 | 203,359 |
| **එකතුව** | **10,927,119** | **382,260** | **48,406,354** | **59,715,733** | **16,135,451** | **75,851,185** | **51,432,238** |
| **අළුත්වැඩියා හා නඩත්තු** | | | | | | | |
| ගොඩනැගිලි | 3,018,577 | - | 4,594,722 | 7,613,299 | 4,594,722 | 12,208,021 | 10,460,080 |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | 4,404,019 | - | 1,944,108 | 6,348,127 | 1,944,108 | 8,292,235 | 6,409,572 |
| පරිගණක | 2,026,157 | - | 4,152,835 | 6,178,992 | 4,152,835 | 10,331,827 | 9,642,576 |
| **එකතුව** | **9,448,752** | **-** | **10,691,665** | **20,140,417** | **10,691,665** | **30,832,082** | **26,512,228** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 12 පරිපාලන වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඖ.ස. වෙළඳ කටයුතු | | | මුළු වෙළඳාම | මුළු වෙළඳාම | මුළු වෙළඳාම | මුළු වෙළඳාම |
|---|---|---|---|---|---|---|---|
(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු පාරිතෝෂිත ගිණුමේ වටිනාකම රු.17,755,139 ක් අඩුවෙන් හා වැටුප් පාලන වෙන්කිරීම් ගිණුමේ වටිනාකම රු.16,375,867 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ ණයගැතියන්ගෙන් සියයට 88.2ක් හෙවත් රු.51,591,790,940 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතුව තිබුණු නමුත්, වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව එදිනට එම ශේෂය රු.47,604,572,802 ක් වූයෙන් එම ශේෂ දෙක අතර රු.3,987,218,138 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ඔසුසල්හි ඉතිරි තොගවල පිරිවැය හා එම තොගවල හුවමාරු වටිනාකම අතර වෙනස හඳුනාගෙන එය නොඉපයූ ලාභ ලෙස ගැලපිය යුතු වුවද, ඉතිරි තොගවල පිරිවැය නිශ්චිතව හඳුනානොගෙන තොග හුවමාරු වටිනාකමින් සියයට 7 කට සමාන රු.65,013,383 ක් පමණක් නොඉපයූ ලාභ ලෙස වෙන් කර තිබුණි.

(ඉ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 1996 සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය ඔසුසල් මඟින් අලෙවි කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම් වලින් 2022 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වී තිබුණු වෛද්‍ය සැපයීම් වල පිරිවැය රු.344,234,681 ක් වුවද එදිනට භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව එහි පිරිවැය රු.324,002,081 ක් වී තිබුණි. ඒ අනුව රු.20,232,600 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස වසර ගණනාවක සිට පැවතියද නිරවුල් කිරීමට අදාළ කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ

අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

3. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ),(ඇ),(ඈ) හා (ඉ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 756 හා 757 (2) | ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර එම සමීක්ෂණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ වාර්තා 2023 මැයි 16 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2022 අප්‍රේල් 26 දිනැති 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනිමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ 51 වන සංවත්සරය වෙනුවෙන් රන් පවුම් සහ මුදල් තෑගි ගෙවීම සඳහා සේවකයන් 54 දෙනෙකු වෙනුවෙන් රු.3,723,400 ක වියදමක් දරා තිබුණි. |
| (ඇ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක පීඊඞී 08/2019 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 ඡේදය | සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි | |
| | (i) 2.3 ඡේදය | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යොමු ගත චක්‍රලේඛනයට අනුකූලව සකස්කර අනුමත කරගෙන නොතිබුණි. |
| | (ii) 4.3 ඡේදය | ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීම හා ආයතනයේ ක්‍රියාකාරීත්වයට බලපාන අවදානම් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සංස්ථාව විසින් අවදානම් කළමනාකරණ කමිටුවක් පත්කළ යුතු වුවද, 2023 මාර්තු 31 දින වන විටත් එම කමිටුව පත් කර නොතිබුණි. |
| (ඉ) | 2022 අප්‍රේල් මස 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(x) ඡේදය | මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් තාවකාලිකව අත්හිට විය යුතු බව දක්වා තිබුණ ද ඉන් බැහැරව ආපදා ණය ලෙස මාණ්ඩලික නිලධාරීන් 26 දෙනෙක් සඳහා රු.6,500,000 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 08/22 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉතිරි නිවාඩු මත දීමනා ගෙවීමේදි සේවකයන්ට හිමි නිවාඩු 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කල යුතු වුවද ඉන් බැහැරව සමාලෝචිත වර්ෂය තුල රු.49,342,486 ක් ඉතිරි අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඩ) 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 09/22 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය | සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයන් හට ප්‍රසාද දීමනා නොගෙවිය යුතු වුවත් ඉන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එක් සේවකයකුට රු.20,000 බැගින් රු.17,822,041 ක් ප්‍රසාද දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඞ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.225 ක් වටිනා Trastuzumab (440 mg) එන්නත් ඒකක 500 ක් මිලදී ගැනිමට අදාලව තෝරාගත් ලංසුකරු විසින් ලංසුව සමග ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ආයතනය සඳහා නිකුත් කල සහතිකයක් නොවූ අතර ඖෂධ නිෂ්පාදන , සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යංශයේ ලේකම් මඟින් සියලු මිලදී ගැනීම් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නතර කරන ලෙස දැනුම් දුන් ආයතනයක් වෙත නිකුත් කර තිබූ සහතිකයක් විය. එමෙන්ම ඉදිරිපත් කර තිබූ ලියාපදිංචි සහතිකයද කල් ඉකුත් වී තිබුණි. ලංසු මිල ගනන් ඇගයූ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුනේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කිරීමට යටත්ව පමණක් අවම මිල ඉදිරිපත් කල ලංසු කරු වෙත ලංසුව පිරිනැමීමට වුවද, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය නොසලකා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් නොකල ලංසු කරු වෙත අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණි.

(ආ) වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2016, 2017 හා 2018 වර්ෂ සඳහා පිරිවැය රු.35,761,504 ක් වූ Furosemide Injection BP 20 mg/2 ml එන්නත් මාත්‍රා ඒකක 5,845,000 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබූ එන්නත් මාත්‍රා 99,000 ක තොගය භාරගැනිමේදි නිරීක්ෂණය වූ අඩුපාඩු හේතුවෙන් මෙම තොගය පිළිගත නොහැකි බවත් ඒ සඳහා නිෂ්පාදන ස්ථායිතා වාර්තාව (Product Stability Report) සපයන ලෙස සැපයුම්කරු වෙත කරන ලද දැනුම් දීම මත සැපයුම්කරු විසින් Accelerate Stability Report සපයා තිබූ අතර එහි සඳහන් ආකාරයට අදාල ඖෂධ අවශ්‍ය ප්‍රමිත සහ පිරිවිතර වලට අනුකූල බවට නිෂ්පාදක සමාගමෙන් දැනුම් දී තිබුණි. එහෙත් එසේ දැනුම් දුන් ලිපි ශීර්ෂ නිෂ්පාදන සමාගම භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂ වලට වඩා සකස් කරන ලද ලිපි ශීර්ෂයක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඇනවුම් කරන ලද මුළු ඒකක ප්‍රමාණයට අදාලව නිෂ්පාදන සමාගම විසින් වරින් වර නිකුත් කරන ලද එන්නත් විශ්ලේෂණ සහතික වල තත්ත්ව පාලන කළමණාකරුගේ අත්සන් හා ආකෘතිය ද එකිනෙකට වෙනස් වුවද එම වෙනස්කම් පිළිබද ප්‍රසම්පාදන අස්ථිත්වය කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියවිලි දත්තවලට අනුව ඉහත සැපයුමට අදාලව සැපයුම්කරු විසින් ලංසු ලේඛන වල සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි නිෂ්පාදකයාගෙන් නොවන වෙනත් ආනයන සමාගම් දෙකක් මගින් එන්නත් මාත්‍රා 3,898,900 ක් ආනයනය කර තිබුණු අතර එම සමාගම් දෙකම ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි සමාගම් නොවන බව නිරීක්ෂණය විය.

(iii) සැපයුම්කරු විසින් සපයා තිබූ මෙම එන්නත සම්බන්ධයෙන් රජයේ රෝහල් 2 ක් හා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වලට අදාලව පරික්ෂණ සිදු කළ ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාරයේ (NMQAL) පරීක්ෂණ වාර්ථාවට අනුව පරීක්ෂා කල එන්නත් Sterility පරීක්ෂණයේ දී බ්‍රිතාන්‍ය ඖෂධීය පිරිවිතර වලට අනුකූල නොවන බවට හා පරීක්ෂාව සඳහා ලැබී තිබූ එන්නත් සාම්පල්වල හා ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාර (NMQAL) වෙත ඉදිරිපත් කරනු ලැබූ ලිපි ගොනු තුල අන්තර්ගත වූ නිෂ්පාදිතයේ ආදර්ශ ඇසුරුම්වල එකිනෙකට වෙනස් විෂමතාවයක් නිරීක්ෂණය විය.මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල මත මෙම එන්නත වහා භාවිතයෙන් ඉවත්කරන ලෙස රජයේ සියළු රෝහල් සහ ආයතන වෙතද, පෞද්ගලික වෙළදසැල් තුළින් ඉවත් කරන ලෙස අදාළ සමාගම වෙතද දැනුම් දී තිබුණි. එම දැනුවත් විම කරන විටත් 2018 හා 2019 වර්ෂවලට අදාල තොගවල කල් ඉකුත්වීමේ දින ඉක්මවා තිබුණි.

(iv) මෙම ඉන්ඩෙන්ටු වලට අදාල තොගවල නිෂ්පාදක වශයෙන් ප්‍රසම්පාදන ලියවිලි හා රේගු නිශ්කාෂණ ලියවිලි වල සඳහන් වූ නිෂ්පාදිත සමාගම අදාල කාලසීමාව තුල මෙම සැපයුම්කරු වෙත කිසිදු අයිතමයක් නොසැපයූ බවත් මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව

තමන්ගේ කිසිදු දැනුවත් භාවයක් නොමැති බවත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙනුවෙන් ව්‍යවහාරික විගණනයක් සිදුකල ආයතනය විසින් විගණනය වෙත ලිඛිතව තහවුරු කල ද අදාල ප්‍රසම්පාදන ලිපිගොනුව තුලවූ ලිපි සහ විශ්ලේෂණ සහතික නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ මගින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද එම ලිපි ශීර්ෂ 2015 ජුනි 10 දින නිෂ්පාදිත සමාගම විසින් සැපයුම්කරු තම ශ්‍රී ලාංකික නියෝජිතයා ලෙස පත් කල බව දක්වමින් ලංසු ලේඛන සමග ඉදිරිපත් කරමින් රූපලාවන්‍ය උපකරණ සහ ඖෂධ (Cosmetic Devices and Drug) අධිකාරිය වෙත එවා තිබුණු ලිපි ශීර්ෂයන්ට වඩා හාත්පසින්ම වෙනස් ලිපි ශීර්ෂ විය.

(v) කොළඹ ජාතික රෝහලෙන් ලබාගත් ඇසුරුම් වලට අදාලව සිදු කල භෞතික පරීක්ෂාවට අනුව මෙම එන්නත ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබූ ආදර්ශ ඇසුරුම් හා වෛද්‍ය සැපයුම් අංශය වෙත ලැබී කොළඹ ජාතික රෝහල තුල ඉතිරි වී තිබූ ඇසුරුම් වල විවිධ වෙනස්කම් නිරීක්ෂණය විය.

(vi) ඉහත කරුණු හේතුවෙන් සැපයුම්කාර සමාගම අසාදු ලේඛණ ගත කිරීමට නීති අංශය වෙත යොමු කර තිබුණද අවශ්‍ය කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි.

(ඇ) පිරිවැය රු.1,488,240 ක් වූ Ceftriaxone Sodium for Injection BP 500mg ඒකක 79,500 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති සැපයුම්කරුවෙකු මගින් මිලදී ගෙන තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත්කර තිබූ ප්‍රසම්පාදන ලියවිලි වලට අනුව සහ ආනයනයේදී රේගු දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර තිබූ ලියවිලිවලට අනුව එන්නතෙහි නිෂ්පාදක වශයෙන් සඳහන් කර තිබූ සමාගමෙන් තොරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණු සමාගමක් මගින් ඖෂධ ආනයනය කර තිබුණි.සැපයුම්කරු විසින් වෛද්‍ය සැපයීම් අංශයට සපයන ලද තොගය සම්බන්ධයෙන් ජාතික ඖෂධ ආරක්ෂණ පරීක්ෂණාගාරයේ සිදු කරණු ලැබූ තත්ත්ව පරීක්ෂණයේ දී USP ලේබල් අවශ්‍යතාවය සහ දැනට පවත්නා ලේබල් වල දක්නට ලැබුණු ලක්ෂණ අතර පැවති වෙනස්කම් හේතුවෙන් අදාල බාණ්ඩ වල තොග භාවිතයෙන් ඉවත් කරන ලෙස දැනුම් දී තිබුණි. අවශ්‍ය පිරිවිතර නොගැලපීම නිසා භාවිතයෙන් ඉවත් කල තොග වෙනුවෙන් වැය වූ පිරිවැය ආපසු ගෙවන ලෙස සංස්ථාව විසින් සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණ ද ඒ බව පිළිනොගත් සැපයුම්කරුව අසාදු ලේඛන ගත කිරීමට කටයුතු නොකර සැපයුම්කරුගේ අත්හිටුවා තිබූ ගෙවීම් වලින් ගුණත්වයෙන් තොර ඖෂධ සැපයීම හේතුවෙන් දැරූ රු,1,860,300 ක පිරිවැය අඩුකර 2022 අගෝස්තු, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී රු.273,598,324 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි.

(ඇ) රාජ්‍ය ඔසුසැල් වල අලෙවිය සඳහා Diclofenac Potassium Tablates (50mg) ඖෂධයෙන් (5x10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 48,000 ක් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ ඇනවුමට අදාලව තෝරාගත් සැපයුම්කරුට ඇසුරුම් ඒකකයක් එක්සත් ජනපද ඩොලර් 0.248 බැගින් එක්සත් ජනපද ඩොලර් 11,904 කට ඇනවුම ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම හා ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා දින 167 ක කාලයක් ගතවී තිබුණි.එමෙන්ම සැපයුම්කරු තෝරා ගන්නා අවස්ථාව වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ එම සැපයුම්කරුගේ ලියාපදිංචිය අවසන් ව තිබුණද එය දීර්ඝ කර ගැනීම සඳහා දින 258 ක කාලයක් ගත වීම ඇනවුමේ ප්‍රමාදයට ප්‍රධාන හේතුව වී තිබුණි. එමෙන්ම ලංසුකරු විසින් 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචිකර ලියාපදිංචි සහතිකය සංස්ථාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂයේ මුල් මාස 5 හි මෙම ඖෂධයේ මාසික සාමාන්‍ය අලෙවිය ඒකක 5000 ක් වූ අතර 2021 ජූනි මස සිට රාජ්‍ය ඔසුසැල් තුල මෙම ඖෂධය හිග වී පැවතුණි. ඒ හේතුවෙන් 2021 ජූනි සිට 2022 අගෝස්තු මස දක්වා සංස්ථාවට අහිමි වූ මුළු අලෙවිය දළ වශයෙන් රු. 9,750,000 ක් විය.මෙම ඖෂධය රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙතින් ද නිෂ්පාදනය කරණු ලැබුවද එමගින් මිලදී ගෙන හෝ ඔසුසැල් තුල පවත්නා ඖෂධ හිගය පියවීම කෙරෙහි සංස්ථාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) රාජ්‍ය ඔසුසල්වල අලෙවිය සඳහා Etoricoxilo Tablats 60(mg) ඖෂධයේ ඇසුරුම් ඒකක 30,000 ක් මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම දෙවන හා අවම පස්වන ලංසු කරුවන් වෙත පිළිවෙලින් ඇනවුමෙන් සියයට 25 හා සියයට 75 ක් වශයෙන් ලංසුව පිරිනමා තිබුණි. කෙසේ නමුදු දෙවන අවම මිලට වඩා සියයට 153 ක මිල වැඩිවීමක් සහිත පස්වන ලංසු කරුට මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් ප්‍රධානය කිරීමට සාධාරණ හේතුවක් විගණනයට නිරීක්ෂණය නොවීය.එමෙන්ම මෙම අයිතමයේ අවම මිල හා උපරිම මිල අතර ඒකකයක රු. 345 ක මිල වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 128 කි.මෙම ප්‍රසම්පාදනයෙන් සියයට 75 ක් දෙවන අවම ලංසුකරු ගෙන් බැහැරව පස්වන අවම ලංසුකරුට ප්‍රධානය කිරීම හේතුවෙන් සංස්ථාවට අතිරේක පිරිවැයක් ලෙස රු. 6,196,462 ක් දැරීමට සිදුවීමෙන් අවම මිලට ඖෂධ සැපයීම වූ සංස්ථාවේ අරමුණින් ද බැහැර වී තිබුණි. එම ඖෂධය ඔසුසැල් තුල හිගව පැවති කාලය දින 329 ක් වී තිබුණි.

(ඊ) රාජ්‍ය ඔසුසැල්වල අලෙවි කිරීම සඳහා Cetrize Syrup 5mg/5ml Bottle වලින් ඇසුරුම් ඒකක 150,000 ක් මිලදී ගැනීම සඳහා 2020 ජූනි 26 දින ලබාදී තිබූ ඇනවුමකට අදාලව අවම මිල ලෙස ඒකකයක් රු. 29.25 ඉදිරිපත් කල ලංසුකරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොමැති බව සඳහන් කරමින් ඒකකයක් රු. 71.30 ක මිලක් ඉදිරිපත් කල දෙවන අවම ලංසුකරුට ඒකකයක් රු. 69.93 කට ඇනවුම ප්‍රදානය කර තිබුණ ද අවම ලංසුකරුගේ ලංසු ලේඛන තුල ලියාපදිංචි සහතිකය ඉදිරිපත්කර තිබුණි.අවම ලංසුකරුට

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කරවාගෙන හෝ අවම ලංසුකරුට මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු නොකිරීමෙන් සංස්ථාවට රු.6,056,940 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී ඇති අතර ඒ හේතුවෙන් මෙම ඖෂධයේ ගැනුම් පිරිවැය අවම ලංසු වටිනාකමට වඩා සියයට 138 ක ප්‍රතිශතයකින් ඉහල ගොස් තිබුණු අතර අවම මිලට ඖෂධ සැපයීමේ අරමුණින් ද බැහැර වී තිබුණි. සැපයුම්කරු ඖෂධ ඒකක 99,000 ක් සැපයීමට කටයුතු නොකිරීම හේතුවෙන් රාජ්‍ය ඔසුසැල්තුල තොග නොමැති තත්ත්වයක් ඇති වී තිබුණි.

(උ) සංස්ථාවේ තොග හා පාලන කළමණාකරුගේ ගැණුම් අධියාචනාවකට අනුව Clonazepam Tablets (0.5mg) යන ඖෂධයෙන් ඇසුරුම් ඒකක 48,000 (25x10)ක් රු. 20,073,806 ක පිරිවැයකට මිලදී ගැනීමට අදාලව අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙත 2020 සැප්තැම්බර් 04 දින නිකුත් කල ඉන්ඩෙන්ඩුවට අදාලව පළමු ඖෂධ තොගය 2021 පෙබරවාරි 08 දින හා අවසන් තොගය 2022 ජනවාරි 12 දින ගබඩාව වෙත ලැබී තිබුණි. ගැණුම් ඇණවුම පිළියෙල කරන අවස්ථාව වන විටත් මෙම ඖෂධයේ මාස 4 කට පෙර තොග අවසන් වී තිබුණු අතර මෙම ඖෂධයේ යලි ඇනවුම් තොග මට්ටම පිළිබඳ අවධානයක් යොමු නොකර ඇනවුම් කිරීම හේතුවෙන් අඛන්ඩව මාස 3,4 ක් රත්මලාන ගබඩාවේ තොග නොමැති තත්ත්වයකට පත් වී තිබුණි. ඖෂධයේ විකුණුම් පුරෝකතනය අනුව වාර්ෂික අවශ්‍යතාවට අනුකූල පරිදි හා තොග ශුන්‍යව පවතින බැවින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූලව හැකි ඉක්මනින් ඖෂධ මිලදීගත යුතු වුවත් ගැනුම් ඇනවුම ඉදිරිපත් කල දින සිට මුළු ඖෂධ ප්‍රමාණය ගබඩාව වෙත ලැබීම සදහා වර්ෂ 2 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. 2018 සිට 2022 වර්ෂය දක්වාම එක සැපයුම්කරුවෙකු ගෙන් මෙම ඖෂධය මිලදී ගෙන තිබුණු අතර ඉන්ඩන්ටුවේ සදහන් දිනයන්ටම ඖෂධ සපයා ගැනීමට සංස්ථාව අපොහොසත් වීම තුලින් 2019 මාර්තු සිට 2022 අගෝස්තු දක්වා අවස්ථා 6 කදී අඛන්ඩව මාස දෙකකට වැඩි කාලයක් ඖෂධයේ අලෙවිය ශුන්‍ය වී තිබුණු බැවින් එම කාලපරිච්ඡේදය තුල සංස්ථාවට අලෙවි ආදායමක්ද ලැබී නොතිබුණි.

(ඌ) වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය මත Cefotaxime Injection USP 1g එන්නත් කුප්පි 250,000 ක් දේශීයව මිලදී ගැනිම සදහා රු. 70.70 ලෙස අවම මිල ඉදිරිපත් කල ලංසුකරුට ඇනවුම සැපයිය හැකි කාලසීමාව දීර්ඝ බව සදහන් කරමින් මෙම ඇනවුම අවලංගු කර නැවත ලංසු කැදවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව ඒකකයක මිල රු. 540 ක් ලෙස ඉදිරිපත් කර තිබූ ලංසු කරු සමග මිල සාකච්ජා කර (එන්නත් 65,000 නොමිලේ සැපයීම මත) එන්නතක ඵලදායී මිල ලෙස රු. 399.60 කට මිලදී ගැනීමට එකඟ වී තිබුණි. එන්නත් කුප්පියක ඇස්තමේන්තු ගත මිල රු. 45.71 ක් ද පළමුව තෝරාගත් සැපයුම්කරුගේ ඒකකයක මිල රු. 70.70 ක් ද වූයෙන් තෝරාගත් සැපයුම්කරුගේ මිලේ පිළිවෙලින් සියයට 774 හා සියයට 465 ක වැඩිවීමක් විය. දෙවන අවස්ථාවේ තෝරාගත් ලංසුකරු පළමු අවස්ථාවේදීද මිල ගනන් ඉදිරිපත් කර තිබූ අතර එහි මිල රු.235 ක් වුවද මාස

2 කට වඩා අඩු කාලයකදී දෙවන වර කැඳවීමේදී ලංසුකරු විසින් මිල රු. 540 ක් ලෙස තීරණය කර තිබීම කෙරහි ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ අවධානය යොමු නොකර ඇනවුම ප්‍රධානය කර තිබුණි.දෙවන ලංසු කැඳවීමේදී තෝරාගත් සැපයුම්කරු වෙත 2019 දෙසැම්බර් 13 දින වන විට ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණ නමුත් පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් අවම මිල ඉදිරිපත් කල ලංසුකරු විසින් දින 45 ක් ඇතුලත එන්නත් ඒකක 250,000 සපයන බව ප්‍රකාශ කර තිබූ නමුත් එය ප්‍රතික්ෂේප කර නැවත වරක් ලංසු කැඳවා තිබුණ තෝරාගත් සැපයුම්කරු දින 30 ක් ඇතුලත ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි.

(එ) වෛද්‍ය සැපයුම් අංශය විසින් 2016 අප්‍රේල් 01 දින ඉදිරිපත් කර තිබුණු ගැණුම් අධියාචනාවට අනුව Ipratropium Pressurized Inhalation BP 20 Mcg/Puff ඖෂධයෙන් ඒකක 130,000 ක් රු. 91,702,000 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙම ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා තුනකදී ලංසු කැඳවීම් සිදුකර තිබුණු අතර පළමු අවස්ථාවේදී සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ඩුව නිකුත් කර ණයවර ලිපි විවෘත කර තිබියදී වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂකගේ දැනුම් දීමකට අනුව පළමු තොගය මාස 09 ක් හා දෙවන තොගය මාස 13 ක් ප්‍රමාදව සැපයීම කරන ලෙස දැනුම් දීම මත අදාල සැපයුම ප්‍රමාදකල නොහැකි බව සැපයුම්කරු දන්වා තිබුණි. සැපයුම්කරු ඖෂධ සැපයීමට එකග වූ දිනට පසුව නිෂ්පාදනයේ ඇතිවූ කාර්මික දෝෂයක් හේතුවෙන් ඖෂධ සැපයිය නොහැකි බව පසුව දැනුම් දී තිබුණි. ඖෂධ සැපයීමේ කොන්දේසි වලට අනුව මෙම ප්‍රසම්පාදනය හදිසි කටයුත්තක් ලෙස සීමිත ලංසු කැඳවා හැකි ඉක්මනින් ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතු බව දන්වා සිටියද ඖෂධය මාස 09 ක් ප්‍රමාද කර ලබාගත යුතු බව දන්වා සිටීම තුලින් මෙම සැපයුම හදිසි අවශ්‍යතාවයක් නොවන බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදනයට අදාළව තුන්වන ලංසු කැඳවූ අවස්ථාවේ ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබූ නමුත් ලියාපදිංචි සහතිකය නැවත ලබාගැනීම මත හා 1987 අංක 03 දරණ පොදු ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි සහතිකය ලබාගැනීමේ කොන්දේසි වලට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් 2017 සැප්තැම්බර් 29 දින ඒකකයක් රු.705.40 ක් බැගින් ඒකක 130,000 ක් සඳහා රු. 91,702,000 ක් වූ වටිනාකමට ඇනවුම ප්‍රධානය කර තිබුණද ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර තිබුණු ඉන්වොයිසිවලට අනුව

සැපයුම්කරු විසින් ඖෂධ ඒකකයක් රු.14.13 බැගින් ඒකක 130,000 ක් රු. 1,836,900 ට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවුනු සමාගමකින් මෙරටට ආනයනය කර සියයට 4892 ක වැඩි මිලකට වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණි. සැපයුම්කරු විසින් නිෂ්පාදිත ඖෂධ ආනයනය කර තිබුණේ ලංසු ලේඛණවල සඳහන් නොවන නිෂ්පාදන සමාගමක් මගිනි.

(iii) සැපයුම්කරු වෙත 2017 ඔක්තෝම්බර් 20 ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණද වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට පෙර ඒම ඖෂධ වල ඇසුරුම, ලේබලය හා රාජ්‍ය ලාංඡනය සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒම තොරතුරු වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. එමෙන්ම ඇණවුමට අදාල පළමු තොගය (ඒකක 6500) ආනයනය කළ දින සිට වෛද්‍ය සැපයීම් අංශය වෙත සැපයීම සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි.

(iv) 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 106(1) වගන්තියට පටහැනිව සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ආනයනය කරන ලද මෙම ඖෂධය ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගෙන් තොරව වෙනත් නිෂ්පාදකයෙකු මගින් මෙරටට ආනයනය කර ඖෂධ ඇසුරුම් වල ලංසු ලේඛණවල සඳහන් නිෂ්පාදකයාගේ විස්තර මුද්‍රණය කර තිබුණි.

(v) සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද ඖෂධය ලියාපදිංචි කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිගොණුවේ ඇතුලත් ඖෂධයේ ආදර්ශ ඇසුරුම් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දී තිබුණු ඖෂධයේ ඇසුරුම් තුල රෝගී උපදෙස් පත්‍රිකාවේ ඇතුලත් තොරතුරු හා ඖෂධ ලේබලයේ ඇතුලත් තොරතුරු අතර හා සැපයුම්කරු විසින් ලංසු ලියවිලි ඉදිරිපත් කිරීමේදී නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ යටතේ දේශීය නියෝජිතයා පිළිබඳ ප්‍රකාශ,අනුකූලතා ලිපි හා අදාල ඖෂධයේ විශ්ලේෂණ සහතික සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණු අතර එම ලිපි ශීර්ෂ වල ද නොසැසදීම් නිරීක්ෂණය විය.

(vi) මෙම ප්‍රසම්පාදනය හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා දින 09 ක් වැනි කෙටිකාලයක් තුලදී ලංසු කැඳවා තිබූ නමුත් ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරු විසින් මෙම තොග සැපයීම සඳහා මාස 5 ත් 8 ක් දක්වා වූ කාලයක් ප්‍රමාද වී තිබූ නමුත් ඒ සඳහා ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) Erthropoetin injection 4000 IU අයිතමය සැපයීම සඳහා ලියාපදිංචි සැපයුම්කරු 06 දෙනකු සිටියද 2022 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු කාලසීමාව තුළ පමණක් ඔසුසැල් කළමනාකරුවන් විසින් 19 වතාවක් පිරිවැය රු.32,008,338 ක් වූ යථෝක්ත අයිතමය මිලදී

ගෙන තිබුනේ ඒක් සැපයුම්කරුවකුගෙන් පමණි.ඒසේ වුවද ඒම වර්ෂය තුළදීම මධ්‍යම මිලදී ගැනීම් ඒකකය විසින් විවෘත මිල ගනන් කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය තුළින් එම අයිතම සෘජු ඇනවුම් මගින් මිලදී ගත් මිලට වඩා අඩු මිලට මිලදී ගෙන තිබුණි. තවද ඔසුසැල් කළමනාකරුවන් විසින් රත්මලාන ප්‍රධාන ගබඩාවේ තොග තත්ත්වය පිළිබඳ අවධානය යොමු නොකර සෘජු මිලදී ගැනීම් සිදු කරනු ලබන අතර අවශ්‍යතාවය ඉක්මවා මිලදී ගැනීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.

## 2.3 වෙනත් කරුණු

-------------------

(අ) කොළඹ 07 ස්ථානගත කර ඇති ඔසුසල සඳහා විදුලි සෝපාන යන්ත්‍රයක් සවිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ගෙවීම් කළ රු. 724,936 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නොනිමි වැඩ යටතේ දක්වා තිබුණ ද වසර 07 ක කාල සීමාවක් ගත වී ඇතත් මෙම විදුලි සෝපානයේ වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) ප්‍රතිපත්තිමය තීරණයන් අනුව විකුණූ දින සිට දින 30ත් දින 45ත් අතර කාලය තුළ දී විකුණුම් වටිනාකම් අදාළ වෙළඳ ණයගැතියන්ගෙන් අයකර ගත යුතු වුව ද 2022 දෙසැම්බර් 31 දිනට රු.1,488,412,962 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය තුළ පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.28,469,916 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හා රු.29,107,267 ක් වර්ෂ 1 ත් වර්ෂ 5ත් අතර කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි. වර්ෂ 5කට වඩා පැරණි රු.10,440,050 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබුණු අතර ඉන් රු.2,368,958 ක් පිළිබඳව පමණක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු රු.51,591,790,940 කින් රු.211,591,892 ක් වර්ෂ 10 ත් වර්ෂ 24 ත් අතර හා රු.3,253,054,350 ක් වර්ෂ 6 ත් වර්ෂ 15 අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉහත දක්වන ලද වර්ෂ 10 ත් වර්ෂ 24 ත් අතර පැරණි රු.211,591,892 ක් පොත් වලින් ලිහා හැරීමට ඉල්ලුම් කර ඇති ශේෂයක් බව නිරීක්ෂණය විය.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.19,538,153,761 කින් රු. 909,181,287 ක් වර්ෂ 2කට වඩා වැඩි කාලයක සිට සැපයුම්කරුවන් වෙත නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු රු.12,524,524 ක් වූ අතර ඉන් රු.9,039,823 ක් වර්ෂ 2 ත් වර්ෂ 15 ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මේ

අතරින් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළ රු.5,975,323 ක් වූ තැන්පතු වලින් 2022 වර්ෂය තුළදී කිසිදු මුදලක් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අත්තිකාරම් රු.424,423,099 කින් රු.1,050,518 ක් වසර 7 ත් වසර 15 ත් අතර කාලයක සිට හා රු.4,308,274 ක් වසර 3 ත් වසර 5 ත් අතර කාලයක සිට අයකර ගැනීමට තිබූ ශේෂයන් විය.

(උ) 2022 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.224,116,822 ක් වූ අතර ඉන් රු.3,219,124 ක වියදමක් වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා කාලයක් ගෙවා නොතිබුණු පැරණි ශේෂ විය.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු විශේෂ ඇණවුම් අත්තිකාරම් රු.21,134,366 කින් රු.982,510 ක් පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙතින් ලැබී තිබුණු නිරවුල් නොවූ වසර 11 කට වඩා පැරණි ශේෂයක් වන අතර ඉතිරි රු.20,151,856 ක් යුනිසෙෆ් ආයතනයෙන් ලැබී තිබුණු වසර 3 කට වඩා පැරණි ශේෂයකින් සමන්විතව තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන් රු.13,813,461 කින් රු.5,678,711 ක් 1997– 2016 කාලයට අයත් පැරණි ශේෂ තුළින් සමන්විත වී තිබුණු අතර මෙම පැරණි ශේෂය තුල නීතිමය ක්‍රියාමාර්ග ගත් ණය ශේෂය වූ රු.1,330,000 ක් හැර ඉතිරි ශේෂය ලිහා හැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට තිබුණි.

(ඒ) 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු සංකීර්ණයෙන් අයවිය යුතු වර්ෂ 5කට වඩා පැරණි රු.14,621,370 ක් වූ ණය ශේෂ මේ දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) නියෝජිත කොමිස් අදාළ නියෝජිතයා වෙත පමණක් ගෙවිය යුතු වුවද, 2006 සිට 2011 වර්ෂ වලට අදාළ ලැබිය යුතු රු.13,375,322ක් වූ නියෝජිත කොමිස් නිරවුල් නොකිරීම හේතුවෙන් කපා හැරීමට ඉල්ලීම් කර තිබුණු අතර සමාලෝචිත හා ඉකුත් වර්ෂයේ නියෝජිත කොමිස් ලෙස රු.330,100 ක් අදාළ නියෝජිතයා වෙත ගෙවා තිබිය දී අදාළ සැපයුම්කරු වෙතද ගෙවා තිබුණි.

(ඕ) සංස්ථාව විසින් ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2007 වර්ෂයේ දී තීරණය කර තිබූ අතර 2023 වර්ෂය වන විට වසර 17 ක් ඒ සඳහා ගත කර තිබූ නමුත් එම අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂයන්හි දී රු. 32,360,230 ක් වටිනා පරිගණක උපාංග අයිතම 09 කින් ඒකක 497 ක් මිලදී ගෙන තිබුණු අතර ඒවායින් පිරිවැය රු. 2,552,125 ක් වූ පරිගණක

හා උපාංග ස්ථාවර වත්කම් අයිතම 04 කින් ඒකක 36 ක් 2023 මාර්තු 17 දින වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

(ක) නිරාකරණය නොවූ තොග ලෙස හඳුනාගත් ඉන්ඩෙන්තු 16 ක වටිනාකම වූ රු. 155,160,182 ක් සඳහා වූ මුළු ගොඩබෑමේ පිරිවැය ලෙස රු. 169,805,776 ක් අදාල සැපයුම්කරුවන් වෙතින් අයකර ගෙන ඇති බව පසු බෙදාහැරීම් අංශය විසින් විගණනයට තහවුරු කර තිබුණ ද විගණිත දිනය වනවිටත් එම තොග විනාශ කර නොතිබූ අතර ඒ සඳහා සංස්ථාවට අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ග) සැපයුම්කරුවන් විසින් වෛද්‍ය සැපයුම් අංශයට සපයා තිබූ නමුත් වෛද්‍ය සැපයුම් අංශය විසින් විවිධ හේතූන් මත භාර නොගෙන පැවති තොග නිරාකරණය කරගැනීමෙන් අනතුරුව එම තොග සැපයුම්කරුවන්ට භාර දීම හෝ භාවිතයට නුසුදුසු සැපයුම් විනාශ කිරීම සිදු කරනු ලැබුවද වටිනාකම රු.21,592,622 ක් වූ ඉන්ඩෙන්තු 03 ක තොග විනාශ කිරීමට 2020 ජුනි 14 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී තිබූ නමුත් විගණිත දිනය වන විටත් එම තොග විනාශ කර නොතිබූ අතර, ඒ සඳහා සංස්ථාවට අමතර පිරිවැයක් දැරීමට ද සිදු වී තිබුණි.

(ච) 2007, 2008, 2009 හා 2012 වර්ෂ වලට අයත් නිරාකරණය නොවූ මාර්ගස්ථ තොගවල පිරිවැය රු.2,000,577 ක් හා රේගු ගාස්තු රු.12,603,168 ක් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ජ) වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනිමට 2022 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.3,405,080,834 ක හරපත් සඳහා රු.1,529,830,488 ක් විගණිත දිනය වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට අසාදු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු ව තිබූ රු.306,112,745 ක් අයකිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ට) මූල්‍ය ප්‍රකාශන වලට අනුව සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විට තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය රු.344,234,681 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී තත්ත්වයෙන් අසමත්, කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධ වල මුළු පිරිවැය රු.60,402,156 ක් විය.ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධ වල මුළු පිරිවැය රු.32,290,438 කින් රු. 23,683,646 ක් 2023 මාර්තු 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත් වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදු වූ මුළු අලාභය රු. 156,502,112 ක් වී තිබුණි.

(ඩ) 2022 දෙසැම්බර් 31 දිනට ඔසුසල්වල භෞතික තොග සමීක්ෂණ වාර්තාවලට අනුව තොග අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.5,591,033 ක් හා රු.5,298,375 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු. 4,850,246 ක් හා රු. 5,408,315 ක් වී තිබුණි. විකුණුම් ඉන්වොයිස් පිළියෙල කිරීමේ දී හා තොග ඇසුරුම් ගත කිරීමේ දී සිදු වන දෝෂ, පරිගණක පද්ධතියේ සිදු වන දෝෂ, කාර්යය මණ්ඩලය මගින් සිදුවන අඩුපාඩු ,පෙති හා කරල් ඖෂධ තොග ලෙස ඇසුරුම් කර නිකුත් කිරීමේ දී සුළු ප්‍රමාණ ලෙස නිකුත් කිරීම මගින් ලේබලයේ අඩංගු ප්‍රමාණය සමග සිදු වන නොසැසඳීම් ආදී කරුණු තොග ඌනතා හා අතිරික්තතා ඇති වීමට හේතුවන බව හඳුනාගෙන තිබුණු නමුත් එම දෝෂ අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගැනීමට හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(න) 2022 වර්ෂයේ සංස්ථාවේ ඔසුසල් වල හානි වූ හා කල් ඉකුත් වූ තොගය රු.8,596,386 ක් වී තිබූ අතර එයින් නුවර ප්‍රාදේශීය ගබඩාවේ හානි වූ හා කල් ඉකුත් වූ තොගය රු.2,870,321 ක් වි තිබුණි. එම ප්‍රමාණය මුළු හානි වූ හා කල් ඉකුත් වූ තොගයෙන් සියයට 33 ක් වූ අතර මෙම හානි වූ හා කල් ඉකුත් වූ තොග සම්බන්ධයෙන් සංස්ථාව විසින් සුදුසු පියවර ගෙන නොතිබීම හේතුවෙන් ද නුවර ප්‍රාදේශීය ගබඩාවේ හානි වූ හා කල් ඉකුත් වූ තොගය ඉකුත් වර්ෂයට වඩා රු. 2,529,036 කින් ඉහල ගොස් තිබුණි.

(ත) 2022 වර්ෂය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබූ තොග අතරින් රු.265,875,152 ක වටිනාකමින් යුත් අයිතම 19 ක් තත්ත්වයෙන් අසමත් වි තිබූ අතර ඉන් අයිතම 11 ක් සඳහා රු.177,703,578 ක හරපත් නිකුත් කර තිබුණද, ඉන් රු.146,614,558 ක මුදලක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි. තොග පළුදු හා හානි වීම මත රු. 552,259 වටිනාකමින් යුත් අයිතම වලින් රු. 485,180 කට හරපත් නිකුත් කර තිබුණද, රු.67,079 ක් අය කර ගෙන නොතිබුණි.

(ද) සැපයුම්කරුවන් වෙත ගෙවීම් විධිමත් කිරීම සඳහා පිහිටුවා තිබුණු කමිටුව මගින් නිර්දේශ කරනු ලබන සැපයුම්කරුවන්ට නිර්දේශිත සීමාවන් තුළ පමණක් ගෙවීම් සිදුකළ යුතු වුවද සංස්ථාව විසින් අවසන් වරට 2022 ජූනි 08 වන දින පවත්වා තිබූ 65 වන කමිටු තීරණයට පටහැනිව 2022 සැප්තැම්බර් 02 දින වන විට සැපයුම් සමාගම් 05 කට එකතුව රු.525,253,395 ක් ගෙවීම් සිදුකර තිබුණි.

(ණ) 2021 වර්ෂයේ වෛද්‍ය සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇනවුමකට අදාලව එක්සත් ජනපද ඩොලර් 128,247,502 ක මුළු පිරිවැයක් යටතේ Pfizer එන්නත් ඒකක 18,999,630 ක්, ඉන්වොයිස්පත් 77 ක් යටතේ ආනයනය කර තිබුණි.ඉන් ඉන්වොයිස්පත් 49 කට ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංස්ථාව විසින් ලබා නොගැනීම හේතුවෙන් ඇනවුමට අදාලව

සියයට 3 ක දඩ මුදලක් ගෙවන තෙක් මුල් ඉන්වොයිස්පත් ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව රඳවා තබා ගැනීම හේතුවෙන් සංස්ථාව විසින් එම එන්නත් වෙනුවෙන් දරණ ලද සේවා ගාස්තු එක්සත් ජනපද ඩොලර් 3,796,802 ක් වෛද්‍ය සැපයුම් අංශයෙන් අයකර ගැනීමට අවශ්‍ය හරපත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අදායමක් ලෙස එම වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# මානව සම්පත් විශ්ලේෂණය

## සේවක වර්ගීකරණය




## සේවක කාල පරිච්ඡේදය




## සේවක වයස් විග්‍රහය







මුළු සේවක සංඛ්‍යාව **919**

# ශ්‍රී ලංකා රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව
# වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - ආදායම් වාර්තාව

රු."000"

## පිරිවැටුම

| විස්තරය | 2022 රු. | 2021 රු. | 2020 රු. | 2019 රු. | 2018 රු. | 2017 රු. | 2016 රු. | 2015 රු. | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම - රා.ඔෟ.ස | 9,945,849 | 9,446,822 | 8,798,047 | 8,924,850 | 7,458,320 | 6,593,401 | 6,127,478 | 5,286,876 | 4,865,151 | 4,320,300 |
| පිරිවැටුම - ර.බෙ.ග | 40,973,117 | 70,853,255 | 54,323,565 | 42,959,660 | 31,436,986 | 25,970,290 | 26,127,912 | 19,176,807 | 17,269,008 | 16,815,666 |
| **මුළු පිරිවැටුම** | **50,918,966** | **80,300,077** | **63,121,612** | **51,884,510** | **38,895,306** | **32,563,691** | **32,255,390** | **24,463,683** | **22,134,159** | **21,135,966** |
| දළ වෙළඳ ලාභය - රා.ඔෟ.ස | 2,069,584 | 2,224,536 | 2,249,676 | 2,279,155 | 1,772,559 | 1,680,368 | 1,656,938 | 1,410,722 | 1,247,074 | 1,136,403 |
| දළ අතිරික්තය - ර.බෙ.ග | 2,789,095 | 4,584,027 | 3,415,072 | 2,717,507 | 2,125,052 | 1,887,026 | 1,850,650 | 1,386,731 | 1,333,198 | 1,185,004 |
| **අතිරික්තය** | **4,858,679** | **6,808,563** | **5,664,749** | **4,996,662** | **3,897,611** | **3,567,394** | **3,507,588** | **2,797,453** | **2,580,272** | **2,321,407** |

**පොදුකාර්ය පිරිවැය**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 107,110 | 88,531 | 287,363 | 91,441 | 73,072 | 53,004 | 43,085 | 51,259 | 25,738 | 17,537 |
| පරිපාලන වියදම් | (2,059,292) | (1,967,159) | (1,753,834) | (1,619,555) | (1,532,485) | (1,288,183) | (1,101,435) | (1,057,970) | (969,744) | (786,904) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (2,045,593) | (1,158,052) | (962,078) | (971,096) | (691,967) | (741,459) | (580,843) | (563,357) | (749,825) | (791,794) |
| **මෙහෙයුම් ලාභය** | **860,904** | **3,771,883** | **3,236,200** | **2,497,452** | **1,746,231** | **1,590,756** | **1,868,392** | **1,227,385** | **886,441** | **760,246** |
| මූල්‍ය පිරිවැය | (13,974) | (10,556) | (10,588) | (10,763) | (1,512) | (1,295) | (1,071) | (1,599) | (124) | (227) |
| බැංකු අයිරා පොලිය | (140) | (569,624) | (686,878) | (317,470) | (67,406) | (35,199) | (5,434) | (734) | (149,659) | (1,384) |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **(4,118,999)** | **(3,705,391)** | **(3,413,378)** | **(2,918,884)** | **(2,293,370)** | **(2,066,136)** | **(1,688,783)** | **(1,623,660)** | **(1,869,352)** | **(1,580,309)** |
| මූල්‍ය ආදායම් | 7,643 | 6,943 | 6,891 | 6,875 | 7,436 | 5,765 | 5,721 | 5,086 | 4,896 | 4,357 |
| **බදු පෙර ලාභය** | **854,433** | **3,198,646** | **2,545,624** | **2,176,094** | **1,684,749** | **1,560,027** | **1,867,608** | **1,230,137** | **741,554** | **762,992** |
| ආදායම් බදු වියදම | 209,710 | 782,230 | 576,401 | 512,225 | 756,823 | 470,595 | 625,863 | 610,539 | 192,145 | 320,008 |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **644,723** | **2,416,416** | **1,969,224** | **1,663,869** | **927,926** | **1,089,432** | **1,241,744** | **619,598** | **549,409** | **442,984** |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 86,102 | 57,438 | 191,755 | (1,926) | 30,453 | (59,575) | 10,049 | 239,887 | (212,044) | (31,574) |
| ප්‍රත්‍යාගණන ලාභය | 71,351 | | | | | | | | | |
| **එකතු විස්තීරණ ආදායම** | **802,176** | **2,473,854** | **2,160,979** | **1,661,943** | **958,380** | **1,029,856** | **1,251,794** | **859,485** | **337,365** | **411,410** |




**මූලික අනුපාත**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය -රා.ඔෟ.ස.(%) | 21 | 23.55 | 25.57 | 25.5 | 23.8 | 25.5 | 27.04 | 26.68 | 25.63 | 26.3 |
| දළ ලාභ අනුපාතය -ර.බෙ.ග.(%) | 6.81 | 6.41 | 6.29 | 6.33 | 6.76 | 7.27 | 7.08 | 7.23 | 7.72 | 7.05 |
| දළ අතිරික්තයට විකිණුම් (%) | 9.54 | 8.43 | 8.97 | 9.63 | 10.02 | 10.96 | 10.87 | 11.44 | 11.66 | 10.98 |
| වාර්ෂික විකුණුම් වර්ධනය-රා.ඔෟ.ස (%) | 5.28 | 7.37 | (1.42) | 19.66 | 13.12 | 7.60 | 15.90 | 8.67 | 12.61 | 0.9 |
| වාර්ෂික විකුණුම් වර්ධනය-ර.බෙ.ග. (%) | (42.14) | 30.35 | 26.45 | 36.65 | 21.05 | (0.60) | 36.25 | 11.05 | 2.6 | 1.2 |
| සමස්ථ විකුණුම් වර්ධනය (%) | (36.56) | 27.15 | 21.66 | 33.40 | 19.44 | 0.96 | 31.85 | 10.52 | 4.72 | 1.17 |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු."000"

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දායක ප්‍රාග්ධනය හා සංචිත** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| තොගය - රා.ඖ.ස | 3,189,712 | 2,396,406 | 2,751,098 | 2,802,020 | 2,754,287 | 1,798,403 | 2,009,502 | 2,364,091 | 1,385,477 | 1,703,222 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග | 40,001 | 936,743 | 1,314,756 | 280,723 | 286,587 | 630,130 | 540,693 | 788,342 | 528,710 | 809,462 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 54,916,913 | 52,164,442 | 33,682,452 | 27,299,630 | 16,319,413 | 7,901,244 | 4,521,175 | 3,051,445 | 2,370,323 | 8,881,602 |
| තැන්පතු හා පෙර ගෙවීම් | 50,797 | 41,906 | 100,917 | 53,931 | 61,219 | 57,979 | 37,614 | 33,046 | 37,964 | 32,948 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 5,613,777 | 1,111,457 | 1,225,358 | 1,114,223 | 1,021,185 | 312,050 | 244,947 | 790,525 | 801,717 | 1,200,667 |
| **මුළු ජංගම වත්කම්** | **63,811,199** | **56,650,954** | **39,074,581** | **31,550,527** | **20,442,691** | **10,699,807** | **7,353,931** | **7,027,449** | **5,124,191** | **12,627,901** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 25,555,706 | 16,164,216 | 16,117,661 | 16,293,739 | 10,423,896 | 3,996,134 | 2,657,620 | 3,347,410 | 2,235,194 | 3,649,362 |
| ගෙවිය යුතු ආදායම් බදු | 190,930 | 1,285,189 | 475,496 | 352,117 | 438,060 | 337,976 | 519,770 | 397,758 | 180,617 | 290,045 |
| විලම්බිත ආදායම් | - | 1,471 | 1,800 | 1,461 | 1,345 | 927 | 1,103 | 1,005 | 748 | 889 |
| කල්බදු වගකීම් | 23,253 | 21,759 | 19,870 | 19,187 | | | | | | |
| ජංගම මූල්‍ය වගකීම් | 15,937,904 | 15,432,057 | 55,929 | 6,310,716 | 2,639,033 | 1,361,444 | 39,703 | 56,689 | 78,739 | 6,254,353 |
| දිගුකාලීන ණය | 1,978,933 | 2,060,544 | 491,355 | | | | | | | |
| **මුළු ජංගම වගකීම්** | **43,686,726** | **34,965,236** | **17,162,111** | **22,977,220** | **13,502,334** | **5,696,481** | **3,218,196** | **3,802,862** | **2,495,298** | **10,194,649** |
| ජංගම නොවන වත්කම් | 2,465,268 | 2,351,605 | 2,329,488 | 2,277,480 | 2,225,337 | 2,179,335 | 2,166,630 | 2,156,615 | 2,138,973 | 1,858,832 |
| ජංගම නොවන වගකීම් | 8,004,715 | 9,904,472 | 11,908,162 | 294,459 | 271,308 | 264,651 | 192,213 | 233,394 | 372,220 | 158,803 |
| **ශුද්ධ වත්කම්** | **14,585,025** | **14,132,848** | **12,333,796** | **10,556,328** | **8,894,386** | **6,918,010** | **6,110,152** | **5,147,807** | **4,395,646** | **4,133,281** |
| **මූලික අනුපාත** | | | | | | | | | | |
| වත්කම් පිරිවැටුම් අනුපාතය (වාර) | 1:20.6 | 1:34.3 | 1:27.1 | 1:22.78 | 1:17.48 | 1:14.94 | 1:14.89 | 1:11.34 | 1:10.35 | 1:11.37 |
| ජංගම අනුපාතය (වාර) | 1;1.47 | 1;1.62 | 1;2.28 | 1:1.37 | 1:1.51 | 1:1.88 | 1:2.29 | 1:1.85 | 1:2.05 | 1:1.24 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.4 | 1:1.6 | 1:2.1 | 1:1.2 | 1:1.3 | 1:1.5 | 1:1.5 | 1:1.02 | 1:1.3 | 1:0.9 |
| පොලී ආවරණය (වාර) | 9.8 | 6.45 | 4.66 | 7.85 | 25.99 | 45.32 | 344.69 | 1676.94 | 5.95 | 552.29 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර)-රා.ඖ.ස | 2.8 | 2.75 | 2.36 | 2.39 | 2.5 | 2.58 | 2.04 | 2.07 | 2.34 | 2.17 |

## විකුණුම් ජාලය

| ලියාපදිංචි කාර්යාලය | | ව්‍යාපාරික කාර්යාලය | |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br>අංක 75 .සර් බාරොන් ජයතිලක මාවත ,<br>කොළඹ.1 ශ්‍රී ලංකාව.<br>දූරකතන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ අඩවිය:<br>www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk | | **ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br>16 වන මහල,"මෙහෙවරපියස"<br>කිරුල පාර,<br>කොළඹ 05.<br>දූරකතන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ අඩවිය:<br>www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk | |
| **විකුණුම් අංශය- රත්මලාන** | දු.ක.011-2632288<br>ෆැක්ස්: 011-2632962 | ජීවනී අංශය - රත්මලාන | දු.ක.011-2622334 |
| **ප්‍රධාන ගබඩාව - රත්මලාන** | දු.ක.011-2634318<br>ෆැක්ස්: 011-2636715 | මහනුවර ගබඩාව- තැන්නෙකුඹුර | දු.ක.081-2240274 |
| ඔසුසල - අක්කරෙයිපත්තුව | දු.ක.067-2057625 | ඔසුසල - කරාපිටිය | දු.ක.091- 2226947 |
| ඔසුසල - අම්පාර | දු.ක.063-2223088 | ඔසුසල - K.D.U | දු.ක.011-2044595 |
| ඔසුසල - ආනමඩුව | දු.ක.032- 2263999 | ඔසුසල -කුරුණෑගල | දු.ක.037-2230840 |
| ඔසුසල - අනුරාධපුර | දු.ක.025-2222181 | ඔසුසල- මැදවච්චිය | දු.ක.025-2121040 |
| ඔසුසල -අවිස්සාවේල්ල | දු.ක.036-2222501 | ඔසුසල - මහරගම | දු.ක.011-2745640 |
| ඔසුසල - බදුල්ල (සතොස) | දු.ක.055- 2229837 | ඔසුසල - මාතලේ | දු.ක.066-2220126 |
| ඔසුසල -බදුල්ල (බස් නැවතුම) | දු.ක.055- 2224700 | ඔසුසල - මාතර | දු.ක.041-2231871 |
| ඔසුසල - බණ්ඩාරගම | දු.ක.038-2288671 | ඔසුසල - මතුගම | දු.ක.034-2248861 |
| ඔසුසල - බේරුවල | දු.ක.034- 2278578 | ඔසුසල -මීනුවන්ගොඩ | දු.ක.011-2295120 |
| ඔසුසල - බොරැල්ල | දු.ක.011-2697660 | ඔසුසල - මොනරාගල | දු.ක.055-2277712 |
| ඔසුසල - කොළඹ 01 | දු.ක.011-2328046 | ඔසුසල - නාගොඩ | දු.ක.034-2222818 |
| ඔසුසල - කොළඹ 04 | දු.ක.011-2587128 | ඔසුසල - නාරාහේන්පිට | දු.ක.011-2055284 |
| ඔසුසල - කොළඹ 07 | දු.ක.011-2694716,<br>011-2672293 | ඔසුසල - මීගමුව | දු.ක.031-2228599 |
| ඔසුසල - දඹුල්ල | දු.ක.066- 2285133 | ඔසුසල -නින්දවූර් | දු.ක.067- 2058208 |
| ඔසුසල - දියතලාව | දු.ක.055- 3551624 | ඔසුසල -නිට්ටඹුව | දු.ක.033-2053499 |
| ඔසුසල - ඇඹිලිපිටිය | දු.ක.047-2261177 | ඔසුසල -නුගේගොඩ | දු.ක.011-2856641 |
| ඔසුසල - කොටුව | දු.ක.011-2336926 | ඔසුසල - පානදුර | දු.ක.038-2234767 |
| ඔසුසල - ගාල්ල | දු.ක.091-2234726 | ඔසුසල -පේරාදෙණිය | දු.ක.081-2386045 |
| ඔසුසල - ගම්පහ | දු.ක.033-2234516 | ඔසුසල -පිළියන්දල | දු.ක. 011- 2613640 |
| ඔසුසල - හම්බන්තොට | දු.ක.047-2222163 | ඔසුසල -පිටකෝට්ටේ | දු.ක.011-2099444 |
| ඔසුසල - හොරණ | දු.ක.034-2205333 | ඔසුසල -පොළොන්නරුව | දු.ක.027-2225465 |
| ඔසුසල - හෝමාගම | දු.ක.011-2891222 | ඔසුසල - රාගම | දු.ක.011-2955219 |
| ඔසුසල - ශ්‍රී ජයවර්ධනපුර රෝහල | දු.ක.011-2779414 | ඔසුසල - රත්මලාන | දු.ක.011-3043789 |
| ඔසුසල - යාපනය | දු.ක.021- 2219262 | ඔසුසල - රත්නපුර | දු.ක.045-2223014 |
| ඔසුසල - මහනුවර | දු.ක.081-2225175 | ඔසුසල - තංගල්ල | දු.ක.047-2241221 |
| ඔසුසල - (මහනුවර දුම්රියපළ) | දු.ක.081-2225176 | | |

අලෙවි හා විකුණුම් අංශය- දු.ක. 011-2430778, 011-2328507, 011-2320356-9